**ලංකා බැංකුව හා එහි පරිපාලිත සමාගම් - 2021**

------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 5 (1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූලික බැංකු පද්ධතිවලින් ලබාගත් මූල්‍ය තොරතුරු පදනම් කරගෙන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි. පසුව අයි.එෆ්.ආර්.එස් ගැලපුම්වලට අදාළ ජ'නල් සටහන් යොදන අතර එම තොරතුරු පැතුරුම්පත්වල පවත්වාගෙන යනු ලැබේ. මෙය දත්ත නැතිවීමට හෝ හැසිරවීමට හේතු විය හැක. එබැවින්, දත්ත නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කිරීම සඳහා පූර්ණ ස්වයංක්‍රීය පද්ධති විසඳුමක අවශ්‍යතාවය බැංකුව විසින් ඇගයීමට ලක් කළ යුතුය. | මේ මොහොතේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලය සකස් කිරීමට බැංකුවට පූර්ණ ස්වයංක්‍රීය පද්ධති විසඳුමක් නොමැත. බැංකුව හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීම, කළමනාකරණ තොරතුරු පද්ධති වාර්තා කිරීම සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල සඳහා සහාය වන ස්වයංක්‍රීය පද්ධතියක් (මූල්‍ය වාර්තාකරණ පද්ධතිය) සංවර්ධනය කිරීමේ අදියරේ සිටී.<br>කෙසේ වෙතත්, වර්තමානයේදී, මූල්‍ය තොරතුරුවලින් බහුතරයක් මූලික ව්‍යාපාර පද්ධතිවලින් ලබාගෙන ඇති අතර, හාණිකරණ ගණනය කිරීමේ ප්‍රධාන කොටස මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මගින් සහය දක්වයි. මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ 3 වන අදියර සම්පූර්ණ කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ස්වයංක්‍රීය කිරීමට බලාපොරොත්තු වේ.<br>තවද, බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණයෙන් පිළියෙල කිරීමේ ක්‍රියාවලිය අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සහ බාහිර විගණකවරුන් විසින් විගණනය කරනු ලබන අතර විගණකවරුන් දෙදෙනා විසින්ම නිර්දේශ කර ඇති පරිදි අවශ්‍ය පාලනයන් ස්ථාපිත කර ඇති බව ඔබේ අවධානයට යොමු කිරීමට කැමැත්තෙමු. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට නිර්දේශ කෙරේ. |

| | | |
|---|---|---|
| (ii) සාමූහික හානිකරණය ගණනය කිරීම සඳහා බැංකුව මෘදුකාංගයක් මිල දී ගෙන තිබුණද, පැහැර හැරීමකදී නිරාවරණය වීම (Exposure at Default - EAD) සහ අපේක්ෂිත ණය පාඩු (Expected Credit Loss - ECL) ගැලපීම් තවමත් අතින් සිදු කරයි. | බැංකුව පැහැර හැරීමේ සම්භාවිතාව (Probability of Default - PD) සහ ණය පැහැර හැරීමකදී සිදු විය හැකි පාඩුව (Loss Given Default - LGD) සමඟ පද්ධතිය හරහා EAD ලබා ගෙන ඇත. ECL ගණනය කිරීමේදී, පද්ධතිය ජනනය කරන ලද PD, LGD සහ EAD භාවිතා වේ. කෙසේ වෙතත්, ආර්ථික සාධක ගැළපුම (Economic Factor Adjustment - EFA) ගණනය කිරීමේ ආකෘතිය සඳහා සිදු කරන ලද මෑතකාලීන වෙනසක් ලෙස ECL ලබා ගැනීමට භාවිතා කරන EFA ගණනය කිරීමේදී අතින් මැදිහත්වීමක් භාවිතා වේ. EFA ආකෘතියේ සිදු වූ මෑත කාලීන වෙනස්කම් ඇතුළත් කරමින් EFA ක්‍රියාවලිය පද්ධතියට ඇතුළත් කිරීමට බැංකුව සැපයුම්කරු සමඟ කටයුතු කරයි. | කිසිදු අතින් ගණනය කිරීමක් සඳහා මැදිහත් වීමකින් තොරව පද්ධතිය හරහා අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීමට නිර්දේශ කෙරේ. |

### 1.5.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමහර පද්ධති අසාර්ථක වීම් හේතුවෙන් පොදු ලෙජර් ශේෂය සහ බැංකු වෙළඳ මූල්‍ය පද්ධතියේ හිඟ ශේෂයන් අතර රු.397,565,454 ක වෙනසක් වාර්තා විය. 2021 මුදල් වර්ෂය තුළදී මේ සම්බන්ධයෙන් සම්පූර්ණ ප්‍රතිපාදන සලසා ඇත. | ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිර්දේශය සහිතව 2022.01.31 දිනැති සටහන මගින් රු. 397,565,454 ක වෙනස වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරන ලද අතර, තොරතුරු පද්ධති විගණනයෙන් සමාලෝචනය කිරීමට උපදෙස් දී ඇත.<br>අභ්‍යන්තර විගණන වාර්තාව නිකුත් කර ඇති අතර, නොපියවූ පොලී ආපසු හැරවීමට අනුමැතිය | නියමිත දිනට අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම සහ පොදු ලෙජරය සහ උප පද්ධති අතර ශේෂයන් නිරන්තර පදනමින් සැසඳීමට නිර්දේශ කෙරේ. |

ඉල්ලා වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව වෙත නව සංදේශයක් ඉදිරිපත් කරනු ඇත.
ඉලක්කගත දිනය:- 2022.12.31

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) අනෙකුත් වගකීම් යටතේ වර්ගීකරණය කර ඇති පහත ගිණුම් සැලකිය යුතු කාල පරිච්ඡේදයක සිට දිගුකාලීන හිඟ ශේෂයන් ලෙස පවතී. දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අදාළ බලධාරීන් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එවැනි ශේෂයන් පිළිබඳ විස්තර පහත දැක්වේ. | බැංකුව විසින් දිගුකාලීන හිඟ අයිතම සසඳා නිරවුල් කිරීමට ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇතකෙසේ . වෙතත්, විවිධ හේතූන් මත ඇතැම් අයිතම පවත්වා ගැනීමට සිදු වන අතර, දිගුකාලීන හිඟ අයිතම නිරවුල් කිරීමට අදාළ ව්‍යාපාරික අංශවලට උපදෙස් දෙනු ඇත.<br><br>**<u>ගෙවීම් ඇණවුම</u>**<br>අදාළ ව්‍යාපාරික අංශ ඔවුන්ගේ අදාළ පිරිවැය මධ්‍යස්ථානවලදී දිගුකාලීන හිඟ අයිතම නිරවුල් කිරීමට අඛණ්ඩව උපදෙස් දෙයි.<br>**<u>හිමිකම් නොලත් ශේෂ ගිණුම</u>**<br>මෙම ගනුදෙනුව ඉරානයේ ෆ්රාබ් කම්පැනි ලිමිටඩ්/නෆ්ට්ඉරාන් ඉන්ටර්ට්‍රෙඩ් | අනෙකුත් වගකීම් ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |

| පොදු ලෙජර ගිණුමේ නම | පොදු ලෙජර අංකය | වටිනාකම රු. | සටහන |
|---|---|---|---|
| ගෙවීම් ඇණවුම | 21818006 | 1,427,646,565 | ශේෂයේ වයස් විශ්ලේෂණය<br>වසර 1 ට අඩු (රු.): 1,039,529,832<br>වසර 1 ත් 5 ත් අතර (රු.): 381,861,269<br>වසර 5 ට වැඩි (රු.): 6,255,464 |
| හිමිකම් නොලත් ශේෂ ගිණුම | 21818009 | 653,410,057 | මෙම ශේෂය වසර 8 ක කාලයක සිට මෙම ගිණුම යටතේ පවතී. |
| එකතු කිරීම වෙත | 22310082 | 125,907,701 | ශේෂයේ වයස් විශ්ලේෂණය<br>වසර: 65,486,051 |

| | | | |
|---|---|---|---|
| යැවූ අයකිරීම් වවුචර ලැබීම් | | | 5 ට වැඩි (රු.): <br> වසර 2 ත් 5 ත් අතර (රු.): 34,448,572.92 <br> වසර 1 (රු.): 25,973,077.56 |
| ව්‍යාජ චෙක්පත් සහ වංචාවන් මත සංචිත | 22310122 | 678,830,827 | මෙම ශේෂය වසර පහක කාල සීමාව ඉක්මවා ඇත. |
| **එකතුව** | | **2,885,795,150** | |

කම්පැනියට සම්බන්ධ වේඉරාන . ය සමහරාජ්‍ය පනවන ලද එක්සත් ජාතීන්ගේ සම්බාධක අනුව, අදාළ වත්කම් අත්හිටුවා ඇත.

එවැනි සමාගම් සතු ගිණුම්වල ශේෂය එවැනි සම්බාධක ඉවත් කරන තුරු හෝ එකඟ විය හැකි අරමුදල් බැහැර කිරීමේ ක්‍රමයක් සාක්ෂාත් කර ගන්නා තෙක් බැංකුවේ පවතී . එක්සත් ජාතීන්ගේ සම්බාධකවලට අනුව මෙම අරමුදල් බෙදා හැරීමට, මාරු කිරීමට හෝ වෙන් කිරීමට බැංකුවට හැකියාවක් නොමැත.

බැංකුව විසින් හිමිකම් නොලත් ශේෂය පිළිබඳ ප්‍රතිපත්තිය අනුමත කර ඇති අතර අනුමත ප්‍රතිපත්තිය / මහ බැංකුවේ උපදෙස් අනුව හිමිකම් නොලත් ශේෂය මහ බැංකුව වෙත පැවරීමට කටයුතු කරනු ඇත.

<u>එකතු කිරීම වෙත යැවූ අයකිරීම් වවුචර ලැබීම්</u>

<u>i). වසර 5කට වැඩි හිඟ ශේෂය</u>

රුකට 64 මිලියන .
අදාළවකාන්තා හා ළමා සහ සහන පදනම සමඟ අධිකරණයේ නඩු පැවතීම *.

<u>ii). වසර 2 ත් 5 ත් අතර හිඟ ශේෂය</u>

එ 97,000 ඩො.ජ. කට අදාළව මාලදිවයින අධිකරණයේ නඩුවක් ඇති මාලදිවයිනේ විකුණන අවස්ථාවේ සිටින වෙළෙන්දා* .

<u>iii). වසරක් තුළ හිඟ ශේෂය</u>

ආපසු අයකිරීමේ කාලය සම්පූර්ණ කිරීමෙන් පසු දින) (ක් ඇතුළත 120 වෙළඳුන්ට ගෙවීම් * .පියවිය යුතුය

*මීට අමතරව, අප සතුව ණය උපදෙස් නොමැති වෙළෙන්දාගේ ගිණුම් වසා දැමීම, වෙළදාම් අවසන් කිරීම ආදිය හේතුවෙන් දිගුකාලීන හිඟ මුදල් කිහිපයක් ඇත.

**ව්‍යාජ චෙක්පත් සහ වංචාවන් මත සංචිත**

සංචිත ගිණුමේ ප්‍රතිපාදන අඩු කිරීම සඳහා අඛණ්ඩ අධීක්ෂණ ක්‍රියාවලියක් සිදු කරයි. නමුත් අධිකරණයේ

| | | | |
|---|---|---|---|
| | | පවතින නඩු නිසා සමහර අයිතම ආපසු හැරවිය නොහැක. | |

**1.6.2 අත්තිකාරම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රාජ්‍ය ව්‍යවසායයන්ට අයත් ණය සහ අත්තිකාරම්වල මුළු හිඟ ශේෂය පසුගිය වසර පහක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. සිදු කරන ලද විශ්ලේෂණයෙන් පහත නිරීක්ෂණ අනාවරණය විය.<br>• 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන්හි මුළු හිඟ ශේෂය මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 30.24 ක් සහ බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 18.90ක් නියෝජනය කර තිබුණි. 2021 වසර තුළදී, එම ප්‍රතිශත එනම් මුළු ණය සහ අත්තිකාරම්වලින් සියයට 44.31 දක්වාත් බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 30.02 දක්වාත් ඉහළ ගොස් ඇති අතර එය පිළිවෙලින් සියයට 47 ක සහ සියයට 29 ක වේගවත් වර්ධනයක් පෙන්නුම් කරයි.<br>• 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම් පදනම රු. බිලියන 3, 803 ක් දක්වා ඉහළ ගියද, ඉන් සියයට 30.02 ක් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබා දී ඇති ණය සහ අත්තිකාරම්වලින් නියෝජනය කරයි.<br>• 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යවසායන්ට අයත් ශේෂ පත්‍රයෙන් බැහැර අගයන් (ණයවර ලිපි, ප්‍රතිග්‍රහණය සහ බැංකු ඇපකර) රු. මිලියන 197,087 ක් වූ අතර, ඉහත කී ශේෂ පත්‍රයෙන් බැහැර වටිනාකම ඇතුළුව රාජ්‍ය ව්‍යවසායන්හි මුළු ණයගැතිභාවය රු. මිලියන 2,385,602 ක් ලෙස වාර්තා විය. එය බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 62.72 ක් නියෝජනය කර තිබුණි. | අදහස් සටහන් කර ගෙන ඇත.<br>• 2022-2024 සංයුක්ත සැලැස්මට අනුව, රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ ණයගැතිභාවය සියයට 30 කට සීමා කරමින්, සමස්ත බැංකුවේ කළඹෙන් සියයට 70 ක් දක්වා පුද්ගලික අංශයේ ණයගැතිභාවය වැඩි කිරීමට බැංකුව සැලසුම් කර ඇත.<br>• කෙසේ වෙතත්, කොවිඩ් වසංගතයෙන් පසුව පැවති ආර්ථික අස්ථාවරත්වය හේතුවෙන්, පුද්ගලික අංශයේ ආයතන දැඩි ලෙස බලපෑමට ලක් වූ අතර විශේෂයෙන් ප්‍රධාන ගනුදෙනුකරුවන් ලෙස රජය සහ රාජ්‍ය ව්‍යවසායන්හි ආයතන (එනම් මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය) පත්වීම හේතුවෙන් පුද්ගලික අංශයේ ණය අපේක්ෂා කළ මට්ටමට ළඟා කරගැනීමට බැංකුවට නොහැකි විය.<br>• ඒ අතරම, රාජ්‍ය බැංකුවක් වීම හේතුකොට ගෙන නියාමන සහ ව්‍යවස්ථාපිත ඉල්ලීම්වලට අනුකූලව සමාජ වගකීම සහ ජාතික අවශ්‍යතා මත රජයට ලබාදෙන ණය වැඩි කිරීමට ලංකා බැංකුවට සිදු විය.<br>• කෙසේ වෙතත්, අදාළ රාජ්‍ය ව්‍යවසායන්හි මිල නියම කිරීමේ උපායමාර්ගවලට සිදු කරන ලද වෙනස්කම්/ප්‍රතිව්‍යුහගත කිරීමේ මුලපිරීම් තුළින් ලාභඅලාභ නොලබන තත්ත්වයට ළඟා වී ඇති අතර ලාභ වාර්තා කිරීමට පටන් ගෙන ඇත. එමඟින් මුදල් ප්‍රවාහයේ වැඩිදියුණු කිරීම් නිරීක්ෂණය වී ඇති | 2022-2024 සංයුක්ත සැලැස්මට අනුකූල වීම සහ ඉලක්කය ප්‍රකාරව රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ ණයගැතිභාවය අඩු කිරීම සහතික කිරීමට නිර්දේශ කෙරේ. |

අතර පවතින පහසුකම් සඳහා පොලී ගෙවීමට ඔවුන්ට හැකි වී ඇත.

- කළමනාකරණය කළ හැකි මට්ටමට රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්හි පවතින සහ විභව නිරාවරණය සීමා කිරීමට පහත උපාය මාර්ග දැන් ක්‍රියාත්මක කර ඇත.

i) ඩීඑස්ටී පරිවර්තිත බැඳුම්කරවලින් (භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුම යටතේ වන ණය පියවීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම) වෙළෙඳපොළ මිල ගණන් යටතේ රු. බිලියන 100 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර මිල දී ගෙන නැවත නිකුත් කරන ලෙස රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටින ලදි. මෙය ඉහත සඳහන් බැඳුම්කරවල වෙළෙඳපොළ වටිනාකම රු. බිලියන 53 කින් ඉහළ නැංවීමට බැංකුවට උපකාර වනු ඇත.

ii) භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමේ ණය ප්‍රමාණය අවම කිරීම සඳහා කාලානුරූපී උපාය මාර්ග ක්‍රියාත්මක කර ඇති අතර, සීමාව රු. බිලියන 40.0 ක් දක්වා අඩු කර ඇත. මෙමගින් භාණ්ඩාගාර ගිණුම තවදුරටත් අයිරා ගැනීම මත වන ද්‍රවශීලතා පීඩනය අඩු කරනු ඇත.

iii) 2022.08.22 දින භාණ්ඩාගාර ලේකම් වෙතින් රු. බිලියන 100 ක් වටිනා ඩීඑස්ටී පරිවර්තිත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදාව වැඩි කිරීමට බැංකුව දැනටමත් ඉල්ලීමක් කර ඇත.

iv) 2022.08.30 වන දින භාණ්ඩාගාරය විසින් බැංකුවේ ඉල්ලීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ/නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර තීරණය ලැබීමට නියමිතය.

v) රාජ්‍ය ව්‍යවසායන්ට අයත් අක්‍රීය ණය වෙනුවට කෙටි කාලීන රජයේ සුරැකුම්පත් ප්‍රදානය කිරීම සඳහා

රජය, භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරමින් පවතී. මාර්ග සංවර්ධන අධිකාරිය සහ ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය සඳහා බැංකුවට දැනටමත් රු. බිලියන 8.5 ක් වටිනා වසර 3 ක භාණ්ඩාගාර බැඳුම්කර පිරිනමා ඇත.

vi) රාජ්‍ය ව්‍යවසායන්හි ණය නිරීක්ෂණය කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව පහත දැක්වෙන ආකාරයෙන් ණය ප්‍රදානය කිරීමට කැමති අවදානම් සීමාවන් (Appetite limits) පනවා ඇත.

අ) සියලුම රාජ්‍ය ව්‍යවසායන් සඳහා අවදානම් සීමාව රු. බිලියන 800 ක් වේ.

ආ) විශේෂිත අවදානම් දැරීමට කැමති සීමාවන්

| ගනුදෙනුකරුගේ නම | අවදානම් දැරීමට කැමති සීමාව (රු. බිලියන) |
|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය | 175.0 |
| මාර්ග සංවර්ධන අධිකාරිය – ඉන්වොයිස් වට්ටම් කිරීම සහ බිල්පත් වට්ටම් කිරීම සඳහා ප්‍රතිලාභියා ලෙස | 15.0 |
| ජාතික ජල සම්පාදන සහ ජලාපවහන | 50.0 |
| ලංකා විදුලිබල මණ්ඩලය | 20.0 |
| වී අලෙවි මණ්ඩලය | 15.0 |
| නාගරික සංවර්ධන අධිකාරිය | 10.0 |

vii) නව පහසුකම් ලබා නොදීමට, දැනටමත් නිකුත් කර ඇති අභිලාශ්‍රය ප්‍රකාශ කිරීමේ ලිපිය අවලංගු කිරීමට සහ පහත සඳහන්

රාජ්‍ය ව්‍යවසායන්ගේ අනුමත සීමාවන් අඩු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- නාගරික සංවර්ධන අධිකාරිය
- වී අලෙවි මණ්ඩලය

viii) ඒ අනුව ඇගයීම් ක්‍රමවේදයට අවශ්‍ය වෙනස්කම් සිදු කර ඇත.

ix) රාජ්‍ය ව්‍යවසායන්හි සහ රජයේ සෑම නව ණය යෝජනාවක් සඳහාම ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය සහ ද්‍රවශීලතාවය පිළිබඳ තථ්‍ය කාලීන තක්සේරුවක් සිදු කරන අතර සංදේශවල එවැනි අවශ්‍යතාවයක් අනිවාර්ය කර ඇත.

x) රජය සහ රාජ්‍ය ව්‍යවසායන් වෙත ණය දීම සහ අරමුදල් සැපයීම සඳහා සුදුසු අවදානම් සීමාවන් ක්‍රියාත්මක කිරීමට යෝජනා කිරීම.

xi) මහ බැංකුවේ බැංකු අධීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති පරිදි, බැංකුව විසින් රජය සහ රාජ්‍ය ව්‍යවසායන් වෙත ණය ලබාදීම සීමා කර ඇති අතර එවැනි ඕනෑම ණය ලබාදීමක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය මත සිදු කරනු ඇත.

xii) ප්‍රමාණාත්මක බැඳීම් නිරවුල් කිරීම මගින් බැංකුව දැනට උග්‍ර විදේශ මුදල් ද්‍රවශීලතා සම්බන්ධ ගැටලු විසඳා ඇත.

xiii) රජය සමහර විදේශ විනිමය බැඳීම් අගරු කර ඇති අතර දෛනික පදනමින් ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන විදේශ විනිමය ගලා ඒම් භාවිතා කරමින් එවැනි ප්‍රමාණාත්මක බැඳීම් සපුරා ඇත.

xiv) වත්මන් ගලා ඒම් වැඩිවන ප්‍රවණතාවය සමඟ අඛණ්ඩව පවතී

| | | | |
|---|---|---|---|
| | | නම්, උපචිත ප්‍රධාන බැදීම් දැනටමත් පියවා ඇති බැවින් විවෘත කර ඇති ණයවර ලිපිවලින් පැන නගින වගකීම් විදැහි පදනම මත භාර ගැනීමට බැංකුව කිසිදු බාධාවක් අපේක්ෂා නොකරයි. | |
| (ii) | භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ලිමිටඩ්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ වී අලෙවි මණ්ඩලය 2021 දෙසැම්බර් 31 දිනට ඉහළම රාජ්‍ය ව්‍යවසායන් 10 ලෙස හඳුනාගෙන ඇත. 2021 දෙසැම්බර් 31 වන දිනට ඉහළම රාජ්‍ය ව්‍යවසායන් 10 හි මුළු හිඟ ශේෂය රු. මිලියන 1,101,087 ක් ලෙස වාර්තා වී ඇති අතර එයට ප්‍රාග්ධන කොටසෙහි හිඟය රු. මිලියන 1,085,738 ක් සහ පොලී කොටසේ හිඟය රු. මිලියන 15,349 ක් ඇතුළත් වේ. මෙය රාජ්‍ය ව්‍යවසායන්ට අයත් මුළු හිඟ ණය සහ අත්තිකාරම්වලින් සියයට 96.44 ක් නියෝජනය කරයි. එබැවින්, ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් මත විශාල යැපීමක් නිරීක්ෂණය විය. | අදහස් සටහන් කර ගෙන ඇත.<br>නියාමන සහ ව්‍යවස්ථාපිත ඉල්ලීම්වලට අනුකූලව සමාජ වගකීම සහ ජාතික අවශ්‍යතා මත රජයට සහ රාජ්‍ය ව්‍යවසායන් වෙත පහසුකම් පුළුල් කිරීමට රාජ්‍ය බැංකුවක් වන ලංකා බැංකුවට බලකෙරේ. | 2022-2024 සංයුක්ත සැලැස්මට අනුකූල වීම සහ ඉලක්කය ප්‍රකාරව රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන්ගේ නිරාවරණය අඩු කිරීම සහතික කිරීමට නිර්දේශ කෙරේ. |
| (iii) | ඉහළ යන අයිරා ශේෂය සීමා කිරීම සඳහා ඩීඑස්ටී අයිරාව මෑතකදී අවස්ථා කිහිපයකදී ප්‍රතිව්‍යුහගත කර ඇති බව නිරීක්ෂණය විය. 2020 සිට 2021 දක්වා වසර දෙකක කාලය තුළදී රු. බිලියන 527 ක අයිරා ශේෂය භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>• මෙම ප්‍රතිව්‍යුහගත කිරීම් හේතුවෙන්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දීර්ඝ කර ඇති අයිරා පහසුකම් අයකර ගැනීම වසර 1 - 10 කාලසීමාවකින් කල් දමනු ලැබේ. මෙම අයිරා සඳහා ප්‍රධාන වශයෙන් අරමුදල් සපයනු ලබන්නේ කෙටි කාලීන ණය ගැනීමේ මූලාශ්‍ර හරහා වන අතර එය වත්කම් සහ බැරකම්වල පරිණත පැතිකඩහි පරතරයක් ජනනය කරනු ඇත.<br>• භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබා දී ඇති ණය පියවීම සඳහා නිකුත් කර ඇති දැනට පවතින බැඳුම්කරවල සාමාන්‍ය බැඳුම්කර අනුපාතය සියයට 10 ක් වන අතර එවැනි බැඳුම්කරවල සාමාන්‍ය වෙළඳපොළ අනුපාතය සියයට 15 කට | කළමනාකරණය කළ හැකි මට්ටමට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමේ අයිරා සඳහා පවතින සහ විභව ණය සීමා කිරීම සඳහා පහත උපාය මාර්ග දැන් ක්‍රියාත්මක කර ඇත.<br>1.6.2 ඡේදයේ (i) වගන්තියට ලබා දී ඇති (i), (ii) සහ (iii) හි පිළිතුරු බලන්න.<br>බැංකුව 2022 මැයි මාසයේ සිට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමේ අයිරා ශේෂය භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කිරීම නතර කර ඇත.<br>මහ බැංකුවේ බැංකු අධීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති පරිදි, බැංකුව විසින් රජය සහ රාජ්‍ය ව්‍යවසායන් වෙත ණය දීම සීමා කර ඇති අතර එවැනි ඕනෑම ණය දීමක් අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය මත සිදු කරනු ඇත. | කළමනාකරණය කළ හැකි මට්ටමේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමේ අයිරා පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ. |

ආසන්න වේ. එබැවින්, එම බැඳුම්කරවල අඩු බැඳුම්කර අනුපාතිකය හේතුවෙන් බැංකුව පාඩු ලබමින් සිටී.

- 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් ගිණුමේ අයිරා ශේෂය රු. මිලියන 430,148 ක් වන අතර රජයේ නිරාවරණය පියවීමේදී 2020 සිට 2021 දක්වා කාලය තුළ නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල පොත් වටිනාකම රු. මිලියන 513,000 කි.

එසේම ජොෂ්ඨ පුරවැසි තැන්පතු සහ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ණය පොලී ශේෂය පියවීම සඳහා 2020 සහ 2021 වර්ෂ තුළදී රු. මිලියන 8,025 ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කර ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

රජයේ මුළු නිරාවරණය රු. මිලියන 1,057,226 ක් වන අතර එය 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම්වලින් සියයට 27.80 ක් පිළිබිඹු කරයි. විස්තර පහත වගුවේ දක්වා ඇත.

| **විස්තරය** | **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන** |
|---|---|
| ඩීඑස්ටී අයිරා ශේෂය | 430,148 |
| ශ්‍රී ලංකා රජයේ ණය | 106,054 |
| ඩීඑස්ටී අයිරා පියවීම සඳහා නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කරවල පොත් වටිනාකම | 513,000 |
| ජොෂ්ඨ පුරවැසි තැන්පතු සහ එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු පොලී ශේෂය පියවීම සඳහා නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර | 8,025 |
| ශ්‍රී ලංකා රජයට ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය | 1,057,227 |
| 2021 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම් | 3,803,284 |
| ශ්‍රී ලංකා රජයට ලබා දී ඇති මුළු ණය බැංකුවේ මුළු වත්කම්වලින් ප්‍රතිශතයක් ලෙස | 27.80% |

(iv) ප්‍රාග්ධනය කොටස සහ පොලී කොටස ආපසු <u>**ශ්‍රී ලංකන් ගුවන් සේවය**</u> යම්

ගෙවීමක් නොමැති වුවද පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් කිහිපයකට ලබා දුන් ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කිරීමෙන් බැංකුව වැළකී තිබුණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත 09 පිළිබඳ මාර්ගෝපදේශය මගින් නියම කර ඇති පරිදි ප්‍රතිව්‍යුහගත කළ වාර ගණන සලකා බැලීමෙන් පසුව ශ්‍රී ලංකන් ගුවන් සේවය වෙත ලබා දී ඇති ණය පහසුකම් 26 ක් සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ලබා දී ඇති ණය පහසුකම් 16 ක් නිවැරදිව වර්ගීකරණය කර නොමැත. ඒ අනුව, තථ්‍ය ණය හානිකරණ, වාර්තාගත මුදලට වඩා බෙහෙවින් වැඩි වනු ඇත.

කොවිඩ් 19 සහ ආර්ථික අර්බුද ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි ව්‍යාපාරයට බොහෝ දුරට බලපා ඇත. බොහෝ වෙන් කිරීම් අවලංගු වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව වෙත මුදල් ගලා ඒම අඩු විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ බැංකුව අතර අඛණ්ඩව ලිපි හුවමාරු කර ඇත. රාජ්‍ය බැංකුවල හිමිකරු ලෙස රජය විසින් නිකුත් කරන ලද රජයේ ඇපකරවලට සහ රජයේ සහන ලිපිවලට එරෙහිව ශ්‍රී ලංකන් ගුවන් සේවය වෙත ලබා දී ඇති පහසුකම්වල ප්‍රධාන කොටසක් සුරක්ෂිත කර ඇති අතර ජාතික අවශ්‍යතාවය සහ රජයේ සුරැකුම්වල පිළිගත හැකි භාවය හේතුවෙන් එවැනි විධිවිධානවලට ගරු කිරීමට බැංකුව බැඳී සිටී.

පිළිගත හැකි මුදල් ප්‍රවාහ සැලැස්මක් සහිතව පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කර නොමැත.

ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් 2022.06.22 දින කල්පිරීමේදී එ.ජ.ඩො මිලියන 1.0 ක කාලීන ණය සහ 2022.10.06 දින රු. මිලියන 450.0 ක ණය පහසුකම ගෙවා ඇත. එසේම, ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් එ.ජ.ඩො මිලියන 10.0 ක හුවමාරුව ගිවිසුම්, එය පරිනත වූ 2022.10.06 දින පියවා ඇත.

බැංකු පහසුකම් සඳහා පොලී ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සේවය හානිකරණ ප්‍රතිපාදන සඳහා 2 වන අදියර යටතේ වර්ගීකරණය කර ඇති අතර 2022.09.30 දින රු. බිලියන 2.7 ක ප්‍රතිපාදන සලසා ඇත.

**<u>ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය</u>**

2019.12.31 දිනට ණය පහසුකම් 16 ක හිඟ ප්‍රාග්ධන කොටස වසර දෙකක සහන කාලයක් සහිතව ප්‍රතිව්‍යුහගත කර ඇත. 2022 දෙසැම්බර් සිට ද්විවාර්ෂිකව එක් එක් ණයවල ඉතිරි කාලය තුළදී

ගනුදෙනුකරුවකුට ප්‍රමාණවත් ප්‍රතිපාදන ගණනය කිරීමට නිර්දේශ කෙරේ.

මුලින් අනුමත කරන ලද මුළු කාලය දීර්ඝ නොවන සහ අනෙකුත් නියමයන් සහ කොන්දේසි වෙනස් නොවන පරිදි ප්‍රාග්ධන කොටස ගෙවිය යුතුය. විධිවිධානයට අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2021.12.30 දක්වා පොලී ගෙවා ඇත. කෙසේ වෙතත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හෝ මහා භාණ්ඩාගාරයෙන් කිසිදු හිතකර ප්‍රතිචාරයක් නොමැතිව අවසාන ද්වි-වාර්ෂික පොලී ගෙවීම වූ රු. බිලියන 2.36 ක් 2022 ජූනි මාසයේ සිට නොපියවා පැවතුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2022.09.01 දිනැති ලිපිය මගින් 2022.06.30 දිනට නියමිතව තිබූ රු. බිලියන 2.36 ක ද්විවාර්ෂික පොලී ගෙවීම 2022.12.31 දක්වා කල් තබන ලෙස ඉල්ලා ඇත.

එමගින්, 2022 දෙසැම්බර් මාසය තුළදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ණය බැඳීම රු. බිලියන 10.0 ක් දක්වා වැඩි කරමින් පොළිය සමඟින් ප්‍රාග්ධන කොටස ගෙවීම 2022 දෙසැම්බර් මාසයේ සිට ආරම්භ වනු ඇති අතර මේ අවස්ථාවේදී මෙම ගෙවීම් සිදු කිරීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අපහසු බව පෙනී යයි.

මෙම තත්ත්වයන් තුළ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ විසින් 2022 දෙසැම්බර් වාරිකය පැහැර හැරීමේ අවදානම සැලකිල්ලට ගනිමින්, කාර්යාල උපදෙස් චක්‍රලේඛ අංක. 60/2021 අනුව, 2022.09.30 දිනෙන් අවසන් කාර්තුව තුළදී හානිකරණ ප්‍රතිපාදන මත II වන අදියර යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ණය කළඹ වර්ගීකරණය කර ඇත.

(v) පසුගිය වසර 5 ක කාලය තුළදී ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනා විශ්ලේෂණය කරන ලද පාස්කු ඉරිදා ප්‍රහාරයත් සමඟ ණය කිසියම් ගැණුම්කරුවන් මුහුණ දුන් ආර්ථික ගනුදෙනුකරුවෙ

අතර සිදු කරන ලද විශ්ලේෂණයෙන් පහත නිරීක්ෂණ අනාවරණය විය.

- 2021 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂය රු. මිලියන 21,455.50 ක් වූ අතර එය එදිනට බැංකුවේ මුළු අක්‍රීය දළ ණය සහ අත්තිකාරම්වලින් සියයට 18.50 ක් නියෝජනය කරයි.
- 2017 මූල්‍ය වර්ෂය හා සසඳන විට 2021 දෙසැම්බර් 31 වන විට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂය සියයට 181.8 කින් හෙවත් රු. මිලියන 13,843.06 කින් ඉහළ ගොස් ඇත. ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂයෙහි චලනයන් පහත වගුවේ දක්වා ඇත.

| විස්තර | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|
| ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ සමස්ථ ශේෂය | 7,612.44 | 12,440.50 | 14,309 | 16,257.55 | 21,455.50 |
| පසුගිය වර්ෂය හා සසඳන විට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 දෙනාගේ ශේෂයේ වැඩි වීම (රු. මිලියන) | - | 4,828.06 | 1,868.50 | 1,948.55 | 5,197.95 |
| පසුගිය වර්ෂය හා සසඳන විට ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන් 10 | - | 63.4% | 15.0% | 13.6% | 32.0% |

පසුබෑම, කොවිඩ් 19 වසංගත තත්ත්වය, ප්‍රමාද සහන කාලසීමාව අවසන් වීම, පොලී අනුපාත ඉහළ නැංවීම සහ රජයේ ප්‍රතිපත්ති තීරණයක් මත අයකරගැනීම්/නීති ක්‍රියාමාර්ග අත්හිටුවීම සම්බන්ධ නොවැළැක්විය හැකි ගැටළු, අක්‍රීය ණය පහසුකම් වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**<u>කේ. ඩී. රිබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගම.</u>**

දැනටමත් බැංකුවට උකස් කර ඇති දේපල සඳහා නව තක්සේරුවක් ලබා ගැනීමට බැංකුව කටයුතු යොදා ඇත. (බලකල විකුණුම් වටිනාකම රු. මිලියන 852 ක් වන අතර වෙළෙඳපොළ වටිනාකම රු. මිලියන 943.90 කි.)

මීට අමතරව, සමාගම විසින් ලබාගත් පහසුකම් සඳහා පිරියත හා යන්ත්‍රෝපකරණ, වාහන උකස් කර ඇත. විස්තර පහත දක්වා ඇත.

| තක්සේරු වාර්තාවේ දිනය | වාහන සහ යන්ත්‍රෝපකරණ ගණන | වෙළෙඳ පොළ වටිනාකම රු. මිලියන | බලකල විකුණුම් වටිනාකම රු. මිලියන |
|---|---|---|---|
| 2021.01.08 | 79 | 282,445,000 | 214,375,755 |
| 2021.05.31 | 295 | 761,613,750 | 642,294263 |
| 2021.05.31 | 119 | 1559,735,804 | 1239,989,964 |

මීට අමතරව, ඉහත සමාගම මාර්ග ව්‍යාපෘති කිහිපයකට සම්බන්ධ වී ඇත. 2022.02.28 වන දිනට අතැති මුළු කුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙනාගේ ශේෂය වැඩි වීමේ ප්‍රතිශතය | | | | | |

- බැංකුවේ ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවේ අඛණ්ඩව ඉහළින්ම සිටින ගනුදෙනුකරුවන් කිහිප දෙනෙක් සිටී. විස්තර පහත දක්වා ඇත.

| ගනුදෙනුකරුගේ නම | **2021.12.31 දිනට මුළු හිඟ මුදල (රු.මිලියන)** | සටහන |
|---|---|---|
| කේ. ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගම | 3,538.81 | පසුගිය වසර 4 තුළදී (2018 සිට 2021 දක්වා) ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරු ලෙස ශ්‍රේණිගත කර ඇත. |
| කඩුවෙල හෝල්ඩිංග්ස් | 1,105.97 | පසුගිය වසර පහක කාලය තුළදී ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවේ අඛණ්ඩව රැඳී සිටී. (2017 - 2021) |
| රුහුණු ඩිවෙලොප්මන්ට් කන්ස්ට්‍රක්ෂන්ස් අන්ඩ් ඉංජිනීයරින් (පුද්) සමාගම | 1,551.92 | පසුගිය වසර තුනක කාලය තුළදී ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවේ අඛණ්ඩව රැඳී සිටී. (2019 – 2021) |
| අනුදන් හෝල්ඩින් (පුද්) සමාගම | 1,286.38 | |
| ආර්.එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම | 1,266.77 | |

ව්‍යාපෘතිවල වටිනාකම රු. බිලියන 10.3 කි. මෙම තත්ත්වය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2022.07.05 දිනැති ඔවුන්ගේ ලිපිය මගින් තහවුරු කර ඇති සම්පූර්ණ සහතික කළ ගෙවීම් රු. මිලියන 641.0 කි.

ඉහත කරුණුවලට අමතරව, බැංකුව 2022.09.30 දිනට රු. මිලියන 4,581.3 ක හානිකරණ ප්‍රතිපාදන සලසා ඇත.

<u>**කඩුවෙල හෝල්ඩිංග්ස්**</u>

පසුගිය වසර පහක කාලය තුළදී ඉහළම අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවේ අඛණ්ඩව රැඳී සිටී. (2017 - 2021)

රු. මිලියන 450.0 ක උකස් ණය, මිලියන 100.0 ක මධ්‍ය කාලීන ණය, රු. මිලියන 426.26 ක ණයවර ලිපි සහ රු. මිලියන 134.09 ක අයිරාවට එරෙහිව ලංකා බැංකුව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

<u>**රුහුණු ඩිවෙලොප්මන්ට් කන්ස්ට්‍රක්ෂන්ස් අන්ඩ් ඉංජිනීයරින් (පුද්) සමාගම**</u>

පවතින පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම සහ සමාගමට නව කාරක ප්‍රාග්ධන පහසුකම් ප්‍රදානය කිරීම සමඟ ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනර්ජීවන උපාය මාර්ගය යටතේ සමාගම සමාලෝචනය කිරීමට බැංකුව සලකා බලයි. සමාගම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පිරිනමන ලද ඉදිකිරීම් ව්‍යාපෘතිවල සම්පූර්ණයෙන්ම නිරත වේ. මුළු මුදල් ප්‍රවාහය බැංකුව වෙත යොමු කර කාලයත් සමඟ සියලු පහසුකම් අයකර ගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

ඒ අනුව, ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපනය අංශය 2021 සැප්තැම්බර් මාසයේදී පුනර්ජීවන සැලැස්ම ක්‍රියාත්මක කර ඇත.

පුනර්ජීවනයෙන් පසු සමාගමේ කාර්ය සාධනය පහත පරිදි වේ..

- ලංකා බැංකුව වෙත යොමු කර ඇති මුළු මුදල් ප්‍රවාහය රු. මිලියන

| | | |
|---|---|---|
| එන්.බී ෆුඩ්ස් (පුද්) සමාගම | 1, 253.48 | |

2391.0 කි.

- අයකර ගත් ප්‍රාග්ධන කොටස: රු. මිලියන 627.0* (*චක්‍රීය සීමාවන් යටතේ ලබා දී ඇති පහසුකම් අයකර ගැනීම ඇතුළුව)
- අයකර ගත් පොළිය: රු. මිලියන 77.7 කි.
- අයකර ගත් කොමිස්/අනෙකුත් ආදායම්: රු. මිලියන 47.2 කි.

රටේ පවතින තත්ත්වය හේතුවෙන් සමාගම බොහෝ ව්‍යාපෘති නවතා දමා ඇත.

මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලැබිය යුතු මුළු මුදල රු.මිලියන 730.0 කි. මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලැබිය යුතු ආදායමෙන් ප්‍රතිලේඛණගත ණය වාරික ගෙවීමට සමාගම එකඟ විය.

**<u>අනුදන් හෝල්ඩින්</u>**

ගනුදෙනුකරු දැනට කාරක ප්‍රාග්ධන පහසුකම් 02 කට පමණක් ගෙවීම් කරන අතර ඉතිරි පහසුකම් 2022 දෙසැම්බර් මාසයෙන් පසුව ප්‍රතිලේඛණගත කිරීමට එකඟ වූ අතර එසේ නොමැතිනම් බැංකුව ඒ සඳහා වත්කම් අත්පත් කර ගැනීමේ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ඇත.

**<u>ආර්.එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම</u>**

සමාගම ශ්‍රී ලංකා රජයේ සහ පෞද්ගලික ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතුවල නිරත වේ. පවතින පහසුකම් ප්‍රතිලේඛණගත කිරීම සහ සමාගමට නව කාරක ප්‍රාග්ධන පහසුකම් ලබා දීමෙන් සමාගම පුනර්ජීවනය කිරීමට බැංකුව තීරණය කර ඇති අතර, ගනුදෙනුකරුගේ මුළු මුදල් ප්‍රවාහය බැංකුව වෙත යොමු කර කාලයත් සමඟ සියලු පහසුකම් අයකර ගැනීමට ගැනීමට බැංකුව අපේක්ෂා කරයි. විශේෂයෙන්ම වර්තමානයේදී සමාගම ශ්‍රී ලංකා රජයේ ව්‍යාපෘතිවලට වඩා පෞද්ගලික ව්‍යාපෘතිවලට ප්‍රමුඛත්වය දෙමින් සිටී.

එ් අනුව, ව්‍යාපාර පුනර්ජීවනය සහ

| | | | |
|---|---|---|---|
| | | පුනරුත්ථාපනය අංශය 2021 දෙසැම්බර් මාසයේදී පුනර්ජීවන සැලැස්ම ක්‍රියාත්මක කර ඇත.<br>පුනර්ජීවනයෙන් පසු සමාගමේ කාර්ය සාධනය පහත පරිදි වේ.<br>• පුනර්ජීවන කාලයට මාරුකිරීමෙන් පසු ජංගම ගිණුමට යොමු කර ඇති මුළු මුදල් ප්‍රවාහය රු. මිලියන 812.0 කි.<br>• අයකර ගත් ප්‍රාග්ධනය කොටස : රු. මිලියන 63.0 කි.<br>• අයකර ගත් පොලිය : රු. මිලියන 20.5 කි.<br>• අයකර ගත් කොමිස් : රු. මිලියන 14.8 කි.<br>• මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් ලැබිය යුතු - රු. මිලියන 44.0 කි.<br>නමුත්, රටේ පවතින තත්ත්වය හේතුවෙන් බොහෝ ව්‍යාපෘති ප්‍රමාද වී ඇති අතර අපේක්ෂිත මුදල් ප්‍රවාහය අඩු වී ඇත. මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් මෙන්ම අනෙකුත් පුද්ගලික ව්‍යාපෘතිවලින් ලැබිය යුතු මුදල් ප්‍රවාහවලින් ප්‍රතිලේඛණගත ණය වාරික ගෙවීමට සමාගම එකඟ වී ඇත.<br>**<u>එන්.බී ෆුඩ්ස් (පුද්) සමාගම</u>**<br>නීතිමය ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කෙරේ. මේ අතර, උකස් කළ දේපල දෙකක් විකිණීම මගින් ණය පහසුකම්වලින් කොටසක් පියවීමට ගනුදෙනුකරු ඉල්ලා ඇති අතර ඒ සඳහා ණය කමිටුවේ අනුමැතිය ඉල්ලා ඇත. | |
| (vi) | යම් වසරකදී ලබා දී ඇති ණය එම වසරේදීම අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇති ගනුදෙනුකරුවන් කිහිප දෙනෙකු සිටී. (ප්‍රතිලේඛණගත කළ පහසුකම් හැර). ඉහත කාණ්ඩයට අයත්වන ඉහළම ගනුදෙනුකරුවන් 10 දෙනා සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදු කර ඇත. 2021 වර්ෂය තුළදී මෙම ගනුදෙනුකරුවන් 10 දෙනා වෙත රු. මිලියන 795.56 ක් ලබා දී ඇති අතර ඉන් සියයට 86 ක් හෙවත් රු. මිලියන 683.77 ක් 2021 වර්ෂයේදීම අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇති බව නිරීක්ෂණය විය. | සෑම මසකම 1 වන සතියේ ණය කමිටුව වෙත රු. මිලියන 5 ට වැඩි සහ ඊට අඩු පහසුකම් සඳහා ණය ලබා දුන් දින සිට පළමු මාස හය ඇතුළත අක්‍රීය ණය පහසුකම් ලෙස සලකනු ලැබූ පහසුකම් වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනික කළමනාකරණ කමිටුව විසින් 2022.05.25 දින අනුමැතිය ලබාගෙන ඇත.<br><br>**<u>එස්.ඩී.කේ යුනයිටඩ් ඇග්‍රී වෙන්චර්ස්</u>** | කිසියම් ගනුදෙනුකරුවෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ. |

**(පුද්.) සමාගම**

සෝයා බෝංචි සහ සෝයා ආහාර ආනයනය කිරීමට සහ සෝයා තෙල් අපනයනය කිරීමට මෙම පහසුකම් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් එස්.ඩී.කේ විසින් "උමේගා" වෙළඳ නාමය යටතේ බඩ ඉරිඟු මිලදී ගැනීම, ගබඩා කිරීම, විකිණීම සහ සෝයා තෙල් නිෂ්පාදනය සිදු කරන අතර දේශීය වෙළඳපොළට සත්ව ආහාර සපයයි. කොවිඩ්19 වසංගතය හේතුවෙන්, එස්.ඩී.කේ හට ඔවුන්ගේ ව්‍යාපාරික කවය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි වූ අතර ව්‍යාපාරික කවය පහත වැටුණි. එබැවින්, එම වසරේදීම කෙටි කාලීන ණය පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.

නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අයකිරීම් පළාත්), සහකාර සමාන්‍යාධිකාරී (අයකිරීම් පළාත්) සහ මැදවච්චිය ප්‍රදේශයේ ප්‍රාදේශීය කළමනාකරු, 2022 අප්‍රේල් මාසයේදී අයකර ගැනීමේ කටයුතු සඳහා එස්.ඩී.කේ වෙත සංචාරයක නියලී ඇත.

මේ වන විට සියලුම පහසුකම් 2022.08.31 දින ව්‍යාපාර පුනර්ජීවන ඒකකය වෙත මාරු කර ඇති අතර පුනර්ජීවන ක්‍රියාවලිය මූලික අදියරේ පවතී.

**ඩී.එස් ගුණසේකර මගී ප්‍රවාහනය සහ ඩී එස් ගුණසේකර (පුද්) සමාගම**

කල්බදු කුලී අයකර ගැනීම සඳහා උප කාලීන ණය නිර්මාණය කිරීම මගින් ප්‍රමාද සහනය ලබා දී ඇත. නව අරමුදල් ගනුදෙනුකරු වෙත ලබා නොදේ. කෙසේ වෙතත්, කොවිඩ් වසංගතය ප්‍රවාහන අංශයට අඛණ්ඩව බලපා ඇති බැවින් උප ණය ද අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.

කල්බදු පහසුකම් හැර දැනට පවතින පහසුකම් සහ උප ණය පහසුකම් ව්‍යාපාර පුනර්ජීවනය සහ

පුනරුත්ථාපනය අංශය වෙත මාරු කර ඇත.

**<u>සෙනාරෝ මෝටර් කම්පැනි (පුද්) සමාගම</u>**

ව්‍යාපාර පුනර්ජීවන කටයුතු ආරම්භ කර ඇති අතර අරමුදල් සම්පාදනය කිරීමේ අදියරේ පවතී. සමාගම තවමත් අවශ්‍ය අනුමැතිය ලබා ගනිමින් සහ ඉදිකිරීම් කටයුතු ආදිය නිම කරමින් සිටින අතර 2023 ජනවාරි සිට මුදල් ප්‍රවාහ උත්පාදනය කිරීමට ගනුදෙනුකරු අපේක්ෂා කරයි.

**<u>කේ ඩී ඊබට් සහ සන්ස් හෝල්ඩින් (පුද්) සමාගම</u>**

කේ ඩී ඊබට් සහ සන්ස් හෝල්ඩින් (පුද්) සමාගමට අදාළව 6.2 **(v)** ඡේදය යටතේ ලබා දී ඇති පිළිතුරු බලන්න.

**<u>අවුරා ඇපරල් එක්ස්පෝර්ට්ස් (පුද්) සමාගම</u>**

අපනයන ඇණවුම් මූල්‍යනය සඳහා පහසුකම ලබා දී ඇත. අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතී.

**<u>අල්මාර් ටීස් (පුද්) සමාගම</u>**

ආයතනික ශාඛාවේ පවත්වාගෙන යන සමාගමේ ගිණුමට ලැබෙන අපනයනය ආදායමෙන් බැංකුව විසින් ඇසුරුම් ණය කිහිපයක් අයකර ගෙන ඇත. නිසි පියවීම් සැලැස්මක් නොමැති වීම හේතුවෙන්, සමාගමේ ණය ගොනු දැනටමත් අයකිරීමේ ආයතනික දෙපාර්තමේන්තුවට මාරු කර ඇත. සමාගමට සහ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග අරම්භ කර ඇත.

**<u>ගිල්ක්‍රිෂ්ට් ලෙෂර් (පුද්) සමාගම</u>**

දැනට පවතින සියලුම පහසුකම් ක්‍රියාකාරී අංශයේ ඇත. සංචාරක කාණ්ඩය යටතේ 2019 වසරේ සිට ප්‍රමාද සහනය ලබා දී ඇත.

**ඩී පී ජයසිංහ ටුවර්ස් ඇනඩ් ට්‍රාන්ස්පෝර්ට් කම්පැනි (පුද්) සමාගම**

කොවිඩ් වසංගත කාලපරිච්ඡේදය තුළදී ප්‍රදානය කරන ලද ප්‍රමාද සහනය සහිත ණයවලින් මෙම ණය සමන්විත වේ.

සමාගම විසින් 2016 ජනවාරි මාසයේ සිට ආයතනික ගනුදෙනුකරුවන්ට කාර්යාල පවත්වා ගැනීම සඳහා කුලියට දීමේ අරමුණින් අංක 717, බේස්ලයින් පාර, කොළඹ 09 හි පිහිටි මහල් 07 කින් යුත් වාණිජ ගොඩනැගිල්ලක් නිම කරන ලද අතර එය මේ දක්වා ක්‍රියාත්මක කර නොමැත. දැනට පවතින බැරකම් සඳහා ලංකා බැංකුවට මුදල් ප්‍රවාහයෙන් සියයට 100 ම අයකර ගැනීම සඳහා සමාගම විසින් භාර ගැනීමේ ලිපි ලබා දී ඇතත්, එය ද ක්‍රියාත්මක වී නොමැත. කොවිඩ් ව්‍යාප්තියේ අඛණ්ඩ බලපෑම සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් තත්ත්වය උග්‍ර විය. මේ වන විට විෂය ණය ඇතුළු සියලුම වගකීම් අක්‍රීය ණයවලට මාරු කර ඇත. එබැවින්, අයකිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා ණය ගොනු 2022.10.14 දින අයකිරීමේ ආයතනික දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇත.

**යූ එස් එස් ඉංජිනියරින් (පුද්) සමාගම**

කාලීන ණය පහසුකම් 2020 වර්ෂයේදී අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.

ණය අංක 88015977 දරන රු. මිලියන 31.5 ක් වූ අවසාන පහසුකම 2021.10.25 දින ලබා දී ඇති අතර හිඟ මුදල රු. මිලියන 3.75 කි. සමාගම සතු දේපළ ඇවර කිරීම මගින් අක්‍රීය ණය තත්ත්වය පියවීමට සමාගම එකඟ විය.

| | | | |
|---|---|---|---|
| (vii) | පසුගිය වසර හතරක කාලය තුළ බැංකුවේ විවිධ ක්ෂේත්‍ර සඳහා ලබා දී ඇති ණය මත අක්‍රීය ණය අනුපාතය ගණනය කිරීම විශ්ලේෂණය කිරීමේදී, නිෂ්පාදන, ප්‍රවාහන හා ගබඩා, ඉදිකිරීම්, සෞඛ්‍ය සේවා, සමාජ සේවා හා සහාය සේවා සහ පරිභෝජන යන අංශවල අක්‍රීය ණය අනුපාතයන් පසුගිය වසර | පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ් 19 පැතිරීම, විනිමය අනුපාත උච්චාවචනය සහ ආර්ථික අර්බුදයේ බලපෑම නිසා පසුගිය වසර හතර තුළදී බැංකුවේ අක්‍රීය ණය අනුපාතය ක්‍රමයෙන් ඉහළ ගොස් ඇත. | බැංකුවේ අක්‍රීය ණය අනුපාතය අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ |

| | | | |
|---|---|---|---|
| | හතරක කාලය තුළදී ක්‍රමයෙන් වැඩි වී ඇති බව නිරීක්ෂණය විය. | 2022.12.31 දක්වා අයකිරීම් / නීතිමය ක්‍රියාමාර්ග අත්හිටුවීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය සමඟ ගැටළුව උග්‍ර වේ. | කෙරේ. |
| (viii) | **<u>සීලෝන් නිව්ස් පේපර්ස් (පුද්) සමාගම වෙත ලබා දී ඇති ණය</u>**<br>සීලෝන් නිව්ස් පේපර්ස් (පුද්) සමාගම වෙත ප්‍රථම පහසුකම 2011 දී ප්‍රදානය කරන ලද අතර 2014 දී ඒවා වැඩි කර ඇත. මුල් වරට 2015 දී සහ නැවත වරක් 2017 දී කාල සීමාව වැඩි කිරීම සහ පැවති පොලී අනුපාත අඩු කිරීම මගින් පහසුකම් ප්‍රතිලේඛණගත කර තිබුණි. සමාගමේ මුළු ණය කළඹ 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ණය 13 කින් සහ උප ණය 11 කින් සමන්විත වන අතර සමස්ත සමූහයේ ණය ප්‍රමාණය රු. මිලියන 2,370 කි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>• 2019 දෙසැම්බර් මාසයේ සිට ලබා දී ඇති ප්‍රධාන ණය 13 න්, පවතින ණය ප්‍රතිලේඛනගත කිරීමට හෝ පවතින ණයවර ලිපි / බිල්පත් ප්‍රතිග්‍රහණය / ණය මාලාවක් (එක්වර සහ සියල්ලට) යටතේ වූ හිඟ මුදල් පරිවර්තනය කිරීමට ණය 11 ක් ලබා දී ඇත.<br>• ප්‍රධාන ණය 13 න්, ණය 9 ක් මාස 24 ක සහන කාලයක් ද තවත් එක් ණයක් මාස 12 ක සහන කාලයක්ද සහිතව ලබා දී ඇත. එබැවින්, මෙම ණය 10 තවමත් ක්‍රියකාරී කාණ්ඩයේ පවතී.<br>• සමාගමේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය අහිතකර විය. සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එය 2011/12 සිට 2019/20 දක්වා සැලකිය යුතු ශුද්ධ අලාභයක් වාර්තා කර ඇති අතර පසුගිය වසර නවයක කාලය පුරා අලාභය සැලකිය යුතු ලෙස වැඩි වෙමින් පවතුණි. සමාගමේ සෘණ ශුද්ධ වටිනාකම 2019/2020 දී රු. බිලියන 3.7 දක්වා ළඟා වී ඇත. මෙම ණය ලබාදීමට පෙර බැංකුව සමාගමේ අහිතකර මූල්‍ය තත්ත්වය සලකා බලා නොමැත.<br>• පිරිනැමීමේ ලිපියේ දක්වා ඇති පහත කොන්දේසි සපුරාලීමට සමාගමට නොහැකි විය.<br>- 2018 මාර්තු 31 දිනට හෝ ඊට පෙර ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. මිලියන 300 දක්වා වැඩි කිරීම.<br>- අධ්‍යක්ෂවරුන් විසින් මාසිකව සහතික කරන ලද තොග සහ ලේඛනගත ණය ප්‍රකාශනයන් සැපයීම.<br>- කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ පිහිටි සමාගමේ | මාසික අයකිරීම් ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහයට ගැලපීමෙන් සමාගමේ මුළු ණය කළඹ 2021 ජුනි මාසයේදී ප්‍රතිව්‍යුහගත කර ඇත. කෙසේ වෙතත්, වසංගත ප්‍රතිවිපාක, අයහපත් ආර්ථික තත්ත්වය, ආනයන සීමා කිරීම් සහ ගෙවීම් එකතු කිරීමේදී මුහුණ දෙන විවිධ දුෂ්කරතා හේතුවෙන් සමාගමේ මුදල් ප්‍රවාහයට බලපෑම් ඇති වී ඇත. එබැවින්, සැලසුම් කළ පරිදි පහසුකම් අයකිරීම සිදු වී නොමැත.<br>ගනුදෙනුකරුගේ ඉල්ලීම මත අපි 2022 මැයි සිට 2022 නොවැම්බර් දක්වා කාලය සඳහා සමාගමේ බොහෝ ණය සඳහා ප්‍රමාද සහනය ලබා දී ඇත.<br>තම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමත් සමඟ වර්තමාන තත්ත්වය මැඩ පැවැත්වීමට සමාගමට නව ව්‍යාපාර සැලැස්මක් ඇත. මෙම අවශ්‍ය වේලාවේදී සමාගමට සහය වීම සඳහා, ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමේ අරමුණින් 2022 අගෝස්තු මාසයේදී ගොනුව ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපන ඒකකය වෙත මාරු කර ඇත. සමාගම විසින් ඉදිරිපත් කරන ලද නව පුනර්ජීවන සැලැස්ම බැංකුව සමීපව අධීක්ෂණය කරන අතර එමගින් හිඟ මුදල් අයකර ගැනීමට සැලසුම් කර ඇත. | කිසියම් ගනුදෙනුකරුවෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ. |

සභාපතිවරයාගේ පුද්ගලික දේපළ විකිණීමෙන් ලැබීමට නියමිත මුදලින් රු. මිලියන 365.4 ක කාලීන ණය පහසුකම යටතේ මුළු හිඟය පියවීම.

- 2020 මැයි 12 දිනැති අංක 2.12 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන අනුව, මෙම සමාගමට තවත් පහසුකම් ලබා නොදීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ ඉල්ලීම මත පදනම්ව රු. මිලියන 850 ක නව ණය පැකේජයක් 2021 මැයි 06 දින අනුමත කර ඇත.
- 2021 නොවැම්බර් 17 දිනැති අංක: 2.6 දරන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සටහන අනුව, උකස් කළ දේපල සඳහා තක්සේරු කණ්ඩායම විසින් අගය කර ඇති වෙළඳපොළ වටිනාකම මත සියයට 100 ක් දක්වා අත්තිකාරම් අනුපාතය සලකා බැලීමට තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, අනෙකුත් පහසුකම් සඳහා වන චක්‍රලේඛ උපදෙස් අනුව, බැංකුවේ තක්සේරුකරුවන් විසින් අගය කර ඇති බලකල විකුණුම් අගය මත පදනම්ව අත්තිකාරම් අනුපාතය සියයට 60 ක් ලෙස සැලකේ. එබැවින්, බැංකුව විසින් සමාගමට වැඩි ණය පහසුකම් ලබා ගැනීමට ඉඩ සලසා දෙමින් වඩාත් හිතකර පිළියම් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(ix) **<u>ශ්‍රෙයි ඉක්විප්මන්ට් ෆිනෑන්ස් සමාගම වෙත ලබා දී ඇති ණය</u>**

ශ්‍රෙයි ඉක්විප්මන්ට් ෆිනෑන්ස් සමාගම ඉන්දියාවේ කල්කටා හි මූලස්ථානය පිහිටි කැනෝරියා පවුල විසින් ආරම්භ කරන ලද කැනෝරියා පදනමේ කොටසකි. ඉන්දියානු සංචිත බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව යටිතල පහසුකම් මූල්‍යකරණය සඳහා භාවිතා කිරීම සඳහා ශ්‍රෙයි ඉක්විප්මන්ට් ෆිනෑන්ස් සමාගමේ ප්‍රමුඛ උපදේශක සහ සංවිධායක ලෙස සිංගප්පූරුවේ ස්ටෑන්ඩර්ඩ් චාටර්ඩ් බැංකුව විසින් එ.ජ.ඩො 110.0 ක සම්මේලික කාලීන ණය පහසුකමක් (Syndicate Term Loan Facility) ලබා දී ඇත. වසර පහක කාලසීමාවකින් ගෙවිය යුතු සම්මේලික ණය සඳහා ලංකා බැංකුවේ දායකත්වය ලෙස බැංකුව 2018 ජූලි 30 වැනි දින එ.ජ.ඩො මිලියන 15.0 ක් ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- 2017 සැප්තැම්බර් 25 දිනැති විද්‍යුත් තැපෑලෙන් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව වෙත රහස්‍ය භාවය පිළිබඳ ගිවිසුම යොමු කරන අවස්ථාවේදී සුරැකුම් ණය යෝජනා ඇගයීම සඳහා මූලික තොරතුරු සෑම විටම ණය ගැනුම්කරුගෙන් ලබා ගනී. සම්මේලික සංවිධායක ලෙස, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව ලංකා බැංකුව වෙත රහස්‍ය ගිවිසුමක් ඉදිරිපත් කර ඇති අතර, තරඟකාරිත්වය තුළ එක් බැංකුවක ව්‍යාපාරික අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම කර්මාන්තයේ සම්මතයක් බව අපි තේරුම් ගෙන ඇත. එවැනි රහස්‍ය ගිවිසුමක් අත්සන් කිරීමෙන්, ණය ගැනුම්කරුගේ හෝ සම්මේලික ණය විධිවිධානයේ කිසිදු සංවේදී තොරතුරක් හෙළි නොකිරීමට සහ ආරක්ෂා කිරීමට ලංකා බැංකුව බැඳී සිටී. ඒකීය ගනුදෙනුවක් සඳහා ණය ගැණුම්කරු වෙත ප්‍රවේශ වීම ද එය වළක්වයි.

ණය ගැනුම්කරු මෙම රහස්‍ය ගිවිසුමෙහි පාර්ශවකරුවෙකු නොවන අතර, සම්මේලික පාර්ශවය සහ සංවිධායකයා

කිසියම් ගනුදෙනුකරුවෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.

ලේඛන සහ වෙනත් අදාළ ලියකියවිලි අත්සන් කිරීම සඳහා අධිකාරය පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොමැත.

- ලංකා බැංකුවේ අක්වෙරළ බැංකු අංශය විසින් සමාගම වෙත යවන ලද 2017 දෙසැම්බර් 07 දිනැති අර්පණ ලිපියට පැවරූ අධිකාරය අනුව නියෝජ්‍ය මහා කළමණාකරු, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය විසින් අත්සන් කර නොමැත.
- වසර හතරක (2014 - 2017) කාලය තුළදී විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාගම සිය මූල්‍ය ප්‍රතිඵලවල පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. සමාගමේ ශුද්ධ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වසර 4 පුරා ඉහළ ගිය සෘණ අගයක් පෙන්නුම් කරයි. සමාගමේ ස්කන්ධයට ණය අනුපාතය ද ඉහළ තෝලන තත්වයක් පෙන්නුම් කරයි.
- 2017 අගෝස්තු 23 දිනැති ඇරයුම් ලිපියේ අමතර තොරතුරු අනුව, මෙම පහසුකම සඳහා සහභාගී වීමට අදහස් කරන සෑම ආයතනයක්ම ණය ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය සහ කටයුතු පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් සිදු කළ යුතු අතර ණය ගැනුම්කරුගේ ණය සුදුසුකම් සහ පහසුකම පිළිබඳ තමන්ගේම තක්සේරුවක් කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව කිසිදු පාරිභෝගික ඇගයීමක් සිදු කර හෝ සමාගමේ අහිතකර මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගෙන නොමැත. සම්මේලික ණය පහසුකම සඳහා භාර කාර ප්‍රමුඛ සංවිධායක (Mandated Lead Arranger) ලෙස ක්‍රියා කරන ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව මත සම්පූර්ණයෙන්ම විශ්වාසය තබා ඇත.
- සුරක්ෂිත ලැබිය යුතු මුදල්වලට එරෙහිව ණය ලබා දී ඇති අතර ණය පහසුකම ලබා දීමට පෙර බැංකුව කිසිදු ස්වාධීන සත්‍යාපනයක් හෝ සුරක්ෂිත ලැබිය යුතු මුදල්වල වයස් විශ්ලේෂණයක් සිදු කර නොමැත.
- මෙම ණය මුදල 2021 දෙසැම්බර් 14 වැනි දින අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත. ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවෙන් ලැබුණු තොරතුරුවලට අනුව, සමාගම බුන්වත් බව ප්‍රකාශ කර ඇති අතර, බැංකු සමූහයේ සෑම පාර්ශවකරුවකුම (Every consortium participant) තනි තනිව හිමිකම් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. කෙසේ වෙතත්, කේ.පී.එම්.ජී වරලත් ගණකාධිකාරීවරුන් විසින් ලෙස, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සම්මේලය (Syndication) සඳහා ප්‍රධාන ගිවිසුම ඉදිරිපත් කරන විට, සහකාර සමානාධිකාරී (අක්වෙරළ බැංකුකරණය) වෙත සම්මේලය සඳහා බැංකුව වෙනුවෙන් එවැනි අවබෝධතාවයකට එළඹවීමේ හැකියාව ඇත.

ඉහත රහස්‍ය ගිවිසුමට තනි තනිව අත්සන් කරන අතරතුර, රහස්‍ය ගිවිසුම හෝ එහි දක්වා ඇති කිසියම් එක් කොන්දේසියට අත්සන් කිරීමෙන් බැංකුවට කිසිදු අලාභයක් සිදුවී නොමැත.

ණය ගැනුම්කරු මෙම පහසුකම හිතාමතා පැහැර හරින අයකු නොවන අතර සමාගම අන්තර්වාර කාලය තුළදී බංකොලොත් තත්ත්වයට පත් කරමින් සමාගමේ මුදල් ප්‍රවාහයට කොවිඩ්-19 වසංගතයේ බලපෑම එල්ල විය.

අර්පණ ලිපිය යනු පහසුකම විස්තර කිරීම, එහි උපලක්ෂණ, එහි ගුණාංග සහ නියම කර ඇති කොන්දේසි ඇතුළත් යෝජිත ආයතනයට කරනු ලබන ඇරයුමකි. එවැනි අර්පණයක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත සංදේශයේ උධෘතයකි. අර්පණය පිළිගත් පසු, ණය ගිවිසුම ඇතුළුව තථ්‍ය ණය ලියකියවිලිවලට බැංකුව සහ ආයතනය එළඹ වේ.

එකී ගිවිසුම නියෝජ්‍ය මහා කළමණාකරු (ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය) විසින් අත්සන් කර ඇත. එම නිසා, පැවරූ අධිකාරයේ අවශ්‍යතාවය සම්පූර්ණයෙන් සිදු කර ඇත.

බැංකුවේ සම්මත ආකෘතියට අනුව, පිරිවැටුම, බදු පසු ලාභය, පොලී, බදු හා ලාභාංශ පෙර ලාභය, ශුද්ධ කාරක ප්‍රාග්ධනය සහ මුළු ණය / ස්කන්ධ යෙහි ප්‍රවණතා පැහැදිලිව පෙන්නුම් කරන මූල්‍ය විශ්ලේෂණය 2017.11.28 දිනැති සංදේශයෙන් ලබා දී ඇත.

සමාගමේ සමස්ථ ආදායමේ පහත

පවත්වන ලද ව්‍යවහාරික විගණනයට අනුව සමාගමේ වත්කම් වගකීම් පියවීමට ප්‍රමාණවත් නොවන බව ඉන්දීය සංචිත බැංකුව විශ්වාස කරයි. එබැවින්, මෙම ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිතය.

වැටීම, ජංගම අනුපාතයේ තත්ත්වය සහ උත්තෝලන අනුපාතයේ තත්ත්වය සංදේශයේ මූල්‍ය ඇගයීම යටතේ පැහැදිලි කෙරේ.

සමාගම ක්ෂුද්‍ර වෙළඳපොලවල් සඳහා ණය සේවාදායකයක් (Loan Server) ලෙස සලකනු ලබන අතර මූල්‍ය ආයතනයක පරාමිතියට අනුකූල වේ. එවැනි මූල්‍ය ආයතනයක වාර්තා සාමාන්‍ය ස්කන්ධයට ණය දර්ශකවලට වඩා ඉහළයි.

සමාගමේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය එ.ජ.ඩො බිලියන 10 ක් විය. ණය පහසුකම ප්‍රදානය කිරීම සඳහා සමාගම තක්සේරු කරන අවස්ථාවේදී එය ඉන්දියාවේ වාසි සහගත ව්‍යාපාරික සමූහවලින් එකක් විය.

අනෙකුත් ණය යෝජනාවලට සමානවම ණය යෝජනාව ඇගයීමට ලක් කර ඇත. ණය නිර්දේශ කරන සහ අනුමත කරන බලධාරීන් සෑහීමකට පත්වන පරිදි ණය විශ්ලේෂණය සහ ණය ගැණුම්කරුගේ ණය සුදුසුකම් තක්සේරු කිරීම සිදු නොකළේ නම්, සාමාන්‍යයෙන් ඔවුන් ණය සංදේශය අනුමත නොකර නිසි ණය ඇගයීමක් සමඟ නැවත ඉදිරිපත් කිරීමට උපදෙස් දෙනු ලබයි. වැඩිදුර තොරතුරු සඳහා, සමාගමේ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය එ.ජ.ඩො බිලියන 10 ක් වූ අතර ණය පහසුකම ප්‍රදානය කිරීම සඳහා සමාගම තක්සේරු කරන අවස්ථාවේදී එය ඉන්දියාවේ වාසි සහගත ව්‍යාපාරික සමූහවලින් එකක් විය.

මෙම සම්මේලික ණය පහසුකම ප්‍රදානය කිරීමේදී, සමාගම සුරක්ෂිත ලැබිය යුතු මුදල් බෙදා දී ඇති අතර සමාගමේ ඉහළම ගනුදෙනුකරුවන් දස දෙනා, සුරක්ෂිත ලැබිය යුතු මුදල්වල ඇතුළත් විය.

CIRP ක්‍රියාවලිය සඳහා කාලරාමුව**.**

| විස්තර | කාලරාමුව |
| --- | --- |
| බුන්වත් බව ආරම්භක දිනය | 2021-10-08 |
| මහජන නිවේදනය ප්‍රකාශයට පත් කිරීම | 2021-10-11 |
| CoC හි 1 වන රැස්වීම | 2021-11-02 |
| CoC වෙත IM ඉදිරිපත් කිරීම | 2021-11-26 |
| ජී පෝරමය ප්‍රකාශයට පත් කිරීම / අභිලාශය ප්‍රකාශ කිරීම (Expression of Interest) සඳහා ඇරයුම | 2022-02-25 |
| අභිලාශය ප්‍රකාශ කිරීම් ඉදිරිපත්වීම | 2022-03-12 |
| යෝජනා ක්‍රියාවලිය (Resolution Process) මගින් යෝජනා අයදුම්පත්වල (Resolution Applications) තාවකාලික ලැයිස්තුව ඉදිරිපත් කිරීම | 2022-03-22 |
| තාවකාලික ලැයිස්තුවට විරෝධතා ඉදිරිපත් කිරීම | 2022-03-27 |
| Eval. Matrix සහ IM ඇතුළත් RFRP නිකුතුව | 2022-04-01 |
| යෝජනා ක්‍රියාවලිය මගින් යෝජනා අයදුම්පත්වල අවසාන ලැයිස්තුව ඉදිරිපත් කිරීම | 2022-04-06 |
| යෝජනා සැලසුම් (Resolution Plans) | 2022-06-07 |

| | |
|---|---|
| ලැබීම (පවත්නා) | |
| යෝජනා සැලසුම් ලැබීම (සංශෝධිත) | 2022-08-30 |
| NCLT හි CoC අනුමත යෝජනා සැලැස්ම ගොනු කිරීමේ අවසාන දිනය | 2022-11-04 |

**2022.05.31 දක්වා මුදල් එකතු කිරීම (පසුගිය මාස අට)**
UCO හි ස්ථාවර තැන්පතු - ඉන්දියන් රුපියල් කෝටි 1,350.00
මුදල් ශේෂය - ඉන්දියන් රුපියල් කෝටි 261.99
එකතුව - ඉන්දියන් රුපියල් කෝටි 1,611.99
**එය එ.ජ.ඩො මිලියන 209.55 කි.**

කෝටි 1 = ඉන්දියන් රුපියල් 10,000,000
ඉන්දියන් රුපියල් 1 = එ.ජ.ඩො 0.013
අනාගත යෝජනා අයදුම්පත් (Prospective Resolution Applications -PRAs) තිදෙනා විසින් පවත්වනු ලබන සක්‍රිය උද්යෝගය (Active Diligence) පිළිබඳව පරිපාලක විසින් CoC සාමාජිකයින් දැනුවත් කරන ලද අතර මේ සම්බන්ධයෙන් PRAs සහ පරිපාලක හා ඔහුගේ උපදේශකයින් ඇතුළු කළමනාකරණ කණ්ඩායම අතර රැස්වීම් කිහිපයක් පවත්වා ඇත.
PRAs තිදෙනා පහත සඳහන් වේ.

1. අරිනා ඉන්වෙස්ටර්ස් එල්පී
2. වීඑෆ්එස්අයි හෝල්ඩින් පීටීඊ ලිමිටඩ් ඇන්ඩ් ශෝන් රන්දහවා
3. රාජේෂ් විරේන් ෂා (එච්එන්අයි)

(x) <u>**ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගමට ලබා දී ඇති ණය**</u>

ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගම යනු පුද්ගලික සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර

2018/2020 කාලසීමාව තුළදී බැංකුව විසින් ව්‍යාපාරය පුනර්ජීවනය කිරීමේ අරමුණින් පහසුකම් කිහිපයක් ලබා දී ඇත.

කිසියම් ගනුදෙනුකරුවෙකුට ණය ලබා දීමට පෙර බැංකුව

පුළුල් පරාසයක පොල් සහ මිශ්‍ර අරක්කු නිෂ්පාදන නිෂ්පාදනය සහ බෝතල් කිරීමෙහි නිරත වේ. බැංකුව විසින් සමාගමට ණය පැකේජයක් ලබා දී ඇති අතර මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

- බැංකුව විසින් 2016 ජූනි 8, 2018 ජූලි 09, 2019 සැප්තැම්බර් 18 සහ 2020 මැයි 12 යන දිනයන්හිදී ඩබ්ලිව් එම් මෙන්ඩිස් ඇන්ඩ් කම්පැනි සමාගම වෙත නව පහසුකම් සහ දැනට පවතින පහසුකම් සඳහා පුළුල් කිරීම් කිහිපයක් අනුමත කර ඇත.
- 2020 මැයි 12 වන දින සමාගමට අනුමත කළ ණය පැකේජයට රු. මිලියන 2,055 ක ප්‍රතිලේඛණගත කළ කාලීන ණයක්, රු. මිලියන 240 ක කාලීන ණයක්, තවත් රු. මිලියන 318 ක ප්‍රතිලේඛණගත කළ ණයක් සහ රු. මිලියන 500 ක අයිරා පහසුකමක් ඇතුළත් වේ. 2020 සහ 2021 වර්ෂ තුළදී සියලුම පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයට මාරු කර ඇත.
- නිෂ්පාදන බලපත්‍රය අලුත් නොකිරීම හේතුවෙන් සමාගමේ ව්‍යාපාරය 2020 ඔක්තෝබර් මාසයේ සිට අත්හිටුවා ඇත. මේ වන විට සුරාබදු දෙපාර්තමේන්තුව විසින් කල්කුඩා කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා එතනෝල් බලපත්‍රය නිකුත් කර ඇති අතර වැලිසර කර්මාන්ත ශාලාවේ එතනෝල් මිශ්‍ර කිරීම නැවත ආරම්භ කිරීම සඳහා මිශ්‍ර කිරීමේ බලපත්‍රය නිකුත් කර ඇති අතර 2022 සැප්තැම්බර් 02 වන දින මිශ්‍ර කිරීමේ නිෂ්පාදනය දැනටමත් ආරම්භ කර ඇත.
- 2017/2018 විගණක වාර්තාවට අනුව, සමාගමේ අඛණ්ඩ අලාභ හා ඍණ ශුද්ධ වත්කම් තත්ත්වය හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම සැක සහිතය. කෙසේ වෙතත්, බැංකුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලුව සැලකිල්ලට නොගෙන අඛණ්ඩව ණය ප්‍රදානය කර ඇත.
- 2021 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුගේ මුළු හිඟ ශේෂය රු. මිලියන 3,417 කි. මුළු හිඟ මුදල්වලින්, රු. මිලියන 858.6 ක් හෙවත් සියයට 25 ක් වැලිසර, කොළඹ පාර, අංක 309 හි පිහිටි උකස් දේපලට එරෙහිව පමණක් සුරක්ෂිත කර ඇත. ඉතිරි රු. මිලියන 2,558 ක් හෙවත් සියයට 75 ක් ණය ගැතියන් මත ඇති උකසට සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ ඒකාබද්ධ සහ තනි ඇපකරවලට එරෙහිව පමණක් සුරක්ෂිත කර ඇත.

ඉහත විධිවිධානවල ප්‍රතිඵලයක් ලෙස, 2018/2020 කාලසීමාව තුළදී රු. මිලියන 300.0 (ආසන්න වශයෙන්) හිඟ පොලී අයකර ගැනීමටත් ප්‍රාග්ධන කොටසින් රු. මිලියන 550.0 ක් අයකර ගැනීමටත් බැංකුවට හැකි විය. තවද, 2018.12.31 වන විට රු. බිලියන 2.3 ක් වටිනා පහසුකම් අක්‍රීය ණය කාණ්ඩයේ සිට ක්‍රියාකාරී කාණ්ඩයට මාරු කිරීමට බැංකුවට හැකි විය.

ඔවුන්ගේ පවතින පහසුකම් ප්‍රතිලේඛණගත කිරීමට සමාගම විසින් කරන ලද ඉල්ලීමට අනුව, සමාගමේ ප්‍රක්ෂේපිත මුදල් ප්‍රවාහයන් මත පදනම්ව 2020.10.16 දින සමාගමට රු. බිලියන 3.1 ක (රු. මිලියන 318.0 ක උපචිත පොලිය ද ඇතුළුව) ප්‍රතිලේඛණගත පැකේජයක් ලබා දී ඇත.

කෙසේ වෙතත්, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මිශ්‍ර කිරීමේ බලපත්‍රය සහ එතනෝල් නිෂ්පාදන බලපත්‍රය ලබා නොදීම සහ රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් යෝජිත මුදල් ප්‍රවාහය බැංකුව වෙත ලැබී නොතිබුණි.

මිශ්‍ර කිරීමේ සහ බෝතල් කිරීමේ මෙහෙයුම නැවත ආරම්භ කිරීමට සහ කල්කුඩා කර්මාන්ත ශාලාවේ එතනෝල් නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා හිඟ සුරාබදු ගෙවීම් ආපසු ගෙවීමේ එකඟතාවයට යටත්ව සමාගමට 2022 අගෝස්තු මාසයේදී සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අදාළ සියලුම බලපත්‍ර ලබා දී ඇත.

සමාගම 2022 සැප්තැම්බර් 02 වන දින වැලිසර කර්මාන්ත ශාලාවේ මිශ්‍ර කිරීමේ නිෂ්පාදනය ආරම්භ කර ඇති අතර පවතින හිඟ මුදල් අයකර ගැනීම සඳහා ප්‍රතිලේඛණගත පැකේජයක් ලබා දීමට බැංකුව සමාගම සමඟ සාකච්ඡා කරමින් සිටී.

විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

<table>
<tr><th></th><th>නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව</th><th>අනුකූල නොවීම</th><th>කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(i)</td><td>2020 සැප්තැම්බර් 10 දිනැති අංක 23/2020 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ 10.2.2 වගන්තිය.</td><td>හානිකරණය සඳහා ඇපකර පදනම මත මුදල් ප්‍රවාහයන් ඇගයීමට ලක් කරන ලද හානිකරණය වූ තනි පුද්ගල ප්‍රමාණාත්මක ණය ගනුදෙනුකරුවන් 57 දෙනෙකුගේ තක්සේරු වාර්තා පරීක්ෂා කිරීමේදී, 2021 දෙසැම්බර් 31 දිනට වලංගු කාල සීමාව ඉක්මවා ඇති තක්සේරු වාර්තා සංඛ්‍යාව 49 ක් බව නිරීක්ෂණය විය. තක්සේරු වාර්තා කල් ඉකුත් වීමට පෙර නව තක්සේරු වාර්තා ලබා ගැනීමට බැංකුව පියවර ගෙන නොමැත.</td><td>නව තක්සේරු වාර්තා ලබා ගැනීම සිදු කරමින් පවතී.</td><td>කල් ඉකුත් වූ සියලුම තක්සේරු වාර්තා සඳහා නව තක්සේරු වාර්තා ලබා ගැනීමට නිර්දේශ කෙරේ.</td></tr>
<tr><td>(ii)</td><td>2020 නොවැම්බර් 20 දිනැති අංක 28/2015 දරන කාර්යාල උපදෙස් චක්‍රලේඛයේ ඇමුණුම II (ඇ)</td><td>ලබා දී ඇති උපරිම මුදල, පහසුකම් සඳහා ඇපයක් ලෙස පිරිනමනු ලබන වාණිජ නිශ්චල දේපල මත බැංකුවේ තක්සේරුවෙන් සියයට 60 කට සීමා කළ යුතුය. කෙසේ වෙතත්, පහත සඳහන් අවස්ථා වලදී, අත්තිකාරම් අනුපාතය බැංකුව විසින් නියම කරන ලද සීමාව ඉක්මවා ඇත. අත්තිකාරම් අනුපාතිකය ඉක්මවීමට අවශ්‍ය අනුමැතිය ලබාගෙන ඇතත් ලබා දී ඇති අත්තිකාරම් ඉහළ අගයක් ගැනීම හේතුවෙන් අයකර ගැනීමේ හැකියාව සැක සහිතය. විස්තර පහත වගුවේ දක්වා ඇත.
<table>
<tr><th>ශාඛාව</th><th>ණය අංකය</th><th>ලබා දී ඇති මුදල රු. මිලියන</th><th>අත්තිකාරම් අනුපාතය</th></tr>
<tr><td>මාතලේ</td><td>81860047</td><td>10</td><td>90</td></tr>
<tr><td>දෙහිවල</td><td>87921034</td><td>19.946</td><td>97.68</td></tr>
<tr><td>පිට</td><td>83021533</td><td>22</td><td>77.5</td></tr>
</table></td><td>වංචල සහ පුද්ගලික ඇපකරුවන්ට වඩා නිශ්චල දේපලවල ප්‍රබලතාවය සුරක්ෂිතභාවය ලෙස සලකා අදාළ පැවරූ අධිකාරයේ අනුමැතිය ඇතිව ඉහළ අත්තිකාරම් අනුපාතයක් සලකා බලා ඇත.<br><br>මාතලේ අධිශ්‍රේණි ශාඛා ණය අංකය 81860047<br>2017 දී රු. මිලියන 10 ක මෙම ණය පහසුකම යෝජනා කරන විට, අත්තිකාරම් අනුපාතය, බලකල විකුණුම් වටිනාකම + ප්‍රමාණ පත්‍රයෙහි සියයට 54 ක් බව ශාඛාව තහවුරු කළ ඇත. දැනට, ශාඛාව අයකිරීමේ ක්‍රියාමාර්ග ලෙස වත්කම් අත්පත් කර ගැනීමේ නීතිමය ක්‍රියාමාර්ග දැනටමත් ආරම්භ කර ඇත.<br>දෙහිවල ශාඛාව<br>ණය අංකය 87921034<br>අශෝක ග්ලාස් ඇන්ඩ් මිරර් (පුද්)</td><td>පැවරූ අධිකාරය තුළ අනුමැතිය ලබා දී ඇතත්, කිසියම් ගනුදෙනුකරු වෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| කොටුව අධිශ්‍රේණිය | 80616471 | 6.88 | 86 |
| | 83705902, 83804150, 83842455, 83842477, 83864905 76636343 (POD) | 129.376 | 120.65 |
| | 81905345 | 16 | 78 |
| | 81905521 | 15.5 | 77.5 |
| | 83649075 83649168 83648984 | 26 | 69.76 |
| | 77628017 | 12.8 | 91 |
| | 85953934 | 5.3 | 91 |
| | 79110440 | 40 | 100 |

සමාගම

මෙය ගනුදෙනුකරුගේ පහසුකම් කිහිපයක් ඒකාබද්ධ කිරීමෙන් ප්‍රතිලේඛණගත කරන ලද පහසුකමකි.

ඒකාබද්ධ කළ පහසුකම සඳහා අමතර සුරකුම් සැපයීමට ගනුදෙනුකරුට නොහැකි වූ බැවින්, එම පහසුකම අත්තිකාරම් අනුපාත සීමාව දිර්ඝ කරමින් නිශ්චල දේපල මගින් සුරක්ෂිත කර ඇත.

**පිටකොටුව අධිශ්‍රේණි ශාඛාව**

ඉහත කී ණය සහ අයිරා, අත්තිකාරම් අනුපාතිකය ඇතුළු අදාළ අනුමැතිය සහිතව දේපළ උකස් කිරීමට එරෙහිව ලබා දී ඇත. ණය පහසුකම් ප්‍රදානය කිරීමේදී, පළවන ආපසු ගෙවීමේ මූලාශ්‍රය ලෙස සමාගමේ මුදල් ප්‍රවාහය සහ දෙවන මූලාශ්‍රය ලෙස කුමන වර්ගයක හෝ සුරකුමක් පිළිබඳව අපි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. ඊට අමතරව, ණය සුදුසුකම, අතීත කාර්ය සාධනය සහ දැනටමත් ලබාගෙන ඇති ණයවල සතුටුදායක ආපසු ගෙවීම් ආදිය සලකා බලනු ලැබේ.

තවද, අපි පහත දෑ උපකල්පනය කරයි.

1. ක්‍රමවත්ව ණය ආපසු ගෙවීමත් සමඟ අත්තිකාරම් අනුපාතය වාසිදායක ලෙස අඩු වේ.
2. අනාගතයේ දී දේපලවල වටිනාකම වැඩි වනු ඇත.

කෙසේ වෙතත්, එම පහසුකම්වලට අදාළව අදාළ අයකිරීමේ ක්‍රියාමාර්ග සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කරමින් සිටී.

| | | | | |
|---|---|---|---|---|
| (iii) | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත | පහත සඳහන් කාලසීමාවන් තුළදී ලංකා බැංකු ආඥාපනතට අනුව අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල වී නොතිබුණි.<br>• 2021 ජනවාරි 01 - 2021 පෙබරවාරි 17 | ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුතු අවම අධ්‍යක්ෂවරුන්ගේ අවශ්‍යතාවයට අනුකූල වීම සම්බන්ධයෙන් නීති දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත.<br>තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා අනුව අප වෙනත් සංශෝධන ඇතුළත් කර ඇත.<br>2022.04.08 වැනි දින ලංකා බැංකුවේ සභාපතිවරයාගේ අත්සනින් අප භාණ්ඩාගාරයේ ලේකම් වෙත එය යොමු කර ඇත. මුදල් අමාත්‍යාංශයෙන් කළ විමසීමකදී එය මුදල් අමාත්‍යාංශයේ නීති දෙපාර්තමේන්තුවේ තිබෙන බවත් ලංකා බැංකු ආඥාපනතේ සංශෝධන කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කිරීමට නියමිත බවත් අනාවරණය විය. | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනතේ අවශ්‍යතාවයට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ (1) වගන්තිය ප්‍රකාරව, සෑම ලියාපදිංචි නිශ්චිත ආයතනයක්ම හෝ ඕනෑම පුද්ගලයෙක්ම, පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ගණන් බලන ලද ලාභ මත ආදායම් බදු ගෙවීමට ප්‍රථම, අවස්ථාචෝචිත පරිදි, ශුද්ධ ලාභ හෝ පාඩු ඇතුළත්වන, ආර්ථික ක්ෂය සඳහා ගැලපීමකට යටත්වන සහ සියලුම සේවකයින්ට ගෙවිය යුතු පඩිනඩි ඇතුළත් වන එක් එක් බදු අයකළ හැකි කාලසීමක් සඳහා ඒ ආයතනයේ අගය එකතුවේ මුළු ගණන මත බදු ගෙවීමට යටත් විය යුතුය. කෙසේ වෙතත්, මුළු අගය එකතු කිරීම ගණනය කිරීම සඳහා බැංකුව රු. 70,016,639 ක් | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මූල්‍ය සේවා මත වැට් බදු ගණනය කිරීමේදී එකී කාර්ය මණ්ඩල වියදම්, පඩිනඩි ලෙස සැලකීමට විරුද්ධ වී නොමැත. | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 ඇ (1) වගන්තියේ අවශ්‍යතාවයට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

වටිනා පඩිනඩි සලකා බලා නැත. පඩිනඩි පිරිවැය හඳුනා නොගැනීම නිසා මූල්‍ය වැට් බදු මුදල රු. 9,073,310 කින් අඩුවෙන් දක්වා ඇත. නොසලකන ලද පඩිනඩි පහත දැක්වේ.

| **ලෙජර් ගිණුම් අංකය** | **විස්තරය** | **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය (රු.)** |
|---|---|---|
| 62503002 | ගාස්තු ගිණුම - කාර්ය මණ්ඩල නිල ඇඳුම් | 7,890,025.33 |
| 62503003 | ගාස්තු ගිණුම - බැංකුකරණය සඳහා HONOR PD | 23,251,637.20 |
| 62101012 | කාර්ය මණ්ඩලයට පාරිතෝෂික ගෙවීම - දෙසැම්බර්-99 | 2,000,000.00 |
| 62101019 | කාර්ය මණ්ඩලයට ගෙවූ දීමනා | 36,550,976.82 |
| 62101018 | ආරක්ෂක කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂික ගෙවීම, ආරක්ෂක ගාස්තු ගෙවීම | 324,000.00 |
| **එකතුව** | | **70,016,639.35** |

(ii) 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 හි (2) ඡේදය අනුව, දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අදාළ රෙගුලාසිවලට අනුව රජයට අයත් ව්‍යවසායන්වල සේවකයින් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ උපයන විට ගෙවන බදු, බදු ගෙවිය යුතු සේවක ඉපැයීම්වලින් අඩු කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ ලංකා බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කර ඇති සාමූහික ගිවිසුම මගින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. එය මත පදනම්ව, 2021 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

බැංකුව සහ ලංකා බැංකු සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මත පදනම්ව, සේවා යෝජකයා ලෙස බැංකුව ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකර ඔවුන්ගේ ආදායම් බදු වගකීම පියවයි.

2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 හි (2) ඡේදයේ අවශ්‍යතාවයට අනුකූල වීමට නිර්දේශ කෙරේ.

සඳහා සේවක ඉපැයීම්වලින් අඩු නොකර සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවන බදු ලෙස බැංකුව රු. 39,912,162 ක් ගෙවා ඇත.

## 1.9 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

**විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

**විගණන නිරීක්ෂණය**

(i) 2021 දෙසැම්බර් 31 දිනට විගණන සමාලෝචනයේදී ඉල්ලා අස් වූ සේවකයින්ගේ පරිශීලක ගිණුම් අක්‍රිය කර නොතිබුණු අතර ඔවුන්ගේ ඉල්ලා අස්වීමේ දිනයන්ට පසුව සක්‍රියව පැවතුණි. පහත වගුවල මෙම ගැටලුවට අදාළ නියැදියක් දක්වයි.

**අයි.සී.බී.එස්**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 217788 | සක්‍රියයි | 2021/12/15 |
| 191841 | සක්‍රියයි | 2021/12/25 |

**උකස් පද්ධතිය**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 217788 | සක්‍රියයි | 2021/12/15 |
| 191841 | සක්‍රියයි | 2021/12/25 |

**සී ටී බිල්ස්**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 217788 | සක්‍රියයි | 2021/12/15 |
| 191841 | සක්‍රියයි | 2021/12/25 |

**ෆිනකල් ට්‍රෙෂරි**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 154500 | සක්‍රියයි | 2021/03/01 |
| 173245 | සක්‍රියයි | 2021/08/24 |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

කිසියම් සේවකයෙකුගේ නැවතීමක් ඇති විට, මානව සම්පත් දෙපාර්තමේන්තුවේ නැවතීමේ ඒකකය ඔහුගේ/ඇයගේ මුරපද පද්ධතිවලින් අක්‍රිය කරන ලෙස පහත අදාළ බලධාරීන්ට දන්වයි.

•විශේෂ ව්‍යාපෘති
•අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව
•තොරතුරු තාක්ෂණ අංශය
•කාඩ් මධ්‍යස්ථානය
•සිග්නේචර් ව්‍යාපෘති
• පසුපෙළ කාර්යාලය
•ස්විෆ්ට් මධ්‍යස්ථානය
•වෙළඳ සේවා ව්‍යාපෘති ඒකකය
•භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය
•ප්‍රේෂණ ලැබීම් දෙපාර්තමේන්තුව
•භාණ්ඩාගාර අංශය

අනාගතයේදී දැඩි ලෙස අනුගමනය කිරීමට සටහන් කර ගෙන ඇත.

**අයි.සී.බී.එස් පද්ධතිය**

පී.එෆ් 217788 සහ පී.එෆ් 191841

**නිර්දේශය**

ඉල්ලා අස්වීමට පෙර ඉල්ලා අස්වන සේවකයින්ගේ පරිශීලක ගිණුම් අක්‍රිය කිරීමට නිර්දේශ කෙරේ.

**ස්කයි ලීස්**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 217788 | සක්‍රියයි | 2021/12/15 |
| 172388 | සක්‍රියයි | 2021/02/08 |

**ස්මාර්ට් රෙමිට්**

| පරිශීලක හැඳුනුම්පත් අංකය | තත්ත්වය | ඉල්ලා අස්වූ දිනය (වර්ෂය/මාසය/දිනය) |
|---|---|---|
| 194291 | සක්‍රියයි | 2021/04/30 |
| 173310 | සක්‍රියයි | 2021/06/11 |

දැනටමත් ඉවත් කර ඇත.

**උකස් පද්ධතිය**

2022.12.31 වන විට නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

**සී ටී බිල්පත්**

පී.එෆ් 217788 සහ පී.එෆ් PF191841 දැනටමත් ඉවත් කර ඇත.

**ෆිනකල් ට්‍රෙෂරි**

පරිශීලකයින් අක්‍රිය කර ඇත

**ස්කයි ලීස්**

පී.එෆ් 217788 සහ පී.එෆ් 191841 යන පරිශීලකයින් ඉවත් කර ඇත.

**ස්මාර්ට් රෙමිට් පද්ධතිය**

පරිශීලකයින් කල් ඉකුත් වූ තත්ත්වයක සිටි අතර පරිශීලකයින් අක්‍රිය කර ඇත.

(ii) පහත පරිශීලක ගිණුම් ද්විගුණනය කර ඇති අතර අයි.සී.බී.එස්, බෙස්24 සහ ස්මාර්ට් රෙමිට් පද්ධතිවල සක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. පහත වගුවල මෙම ගැටලුවට අදාළ නියැදියක් දක්වයි.

**අයි.සී.බී.එස්**

| පී.එෆ් අංකය | පරිශීලක නාමය | තත්ත්වය |
|---|---|---|
| 120224 | පී.එෆ් 120224 | සක්‍රියයි |
| 120224 | පී.එෆ් 120224ඒ | සක්‍රියයි |
| 120224 | පී.එෆ් 120224අයි.සී | සක්‍රියයි |
| 128793 | පී.එෆ් 128793 | සක්‍රියයි |
| 128793 | පී.එෆ් 128793ඒ | සක්‍රියයි |
| 128793 | පී.එෆ් 128793අයි.සී | සක්‍රියයි |
| 140096 | පී.එෆ් 140096 | සක්‍රියයි |
| 140096 | පී.එෆ් 140096ඒ | සක්‍රියයි |
| 140096 | පී.එෆ් 140096අයි.සී | සක්‍රියයි |

**බෙස්24**

| පරිශීලක හැඳුනු | පරිශීලක නාමය | තත්ත්වය |
|---|---|---|

**අයි.සී.බී.එස්**

සමහර පරිශීලකයින්ට විවිධ ක්‍රියා භූමිකාවන් සඳහා විවිධ පරිශීලක හැඳුනුම්පත් ඇත. එබැවින් විවිධ ප්‍රත්‍යයන් (suffixes) භාවිතා කරමින් සිටී. පී.එෆ් 120224, පී.එෆ් 128793 සහ පී.එෆ් 140096 විශේෂ ව්‍යාපෘතියට අනුයුක්ත යෙදුම් කළමනාකරුවන් වන අතර ඔවුන්ට විවිධ

නියමිත කාල ඉලක්කය තුළදී ද්විගුණනය කර ඇති පිවිසුම් ඉවත් කිරීමට නිර්දේශ කෙරේ.

| ම්පත් අංකය | | |
|---|---|---|
| 139401 | PROD.IT139401 | සක්‍රියයි |
| 139401 | SEC-IT139401 | සක්‍රියයි |
| 203810 | PROD.IT2038 | සක්‍රියයි |

රැකියා භූමිකාවන් සඳහා සක්‍රිය මෙම පරිශීලක හැඳුනුම්පත් අවශ්‍ය වේ.

**බේස්**24

පද්ධති නිර්මිතය **(**system architecture**)** අනුව විවිධ පරිශීලක භූමිකාවන් භාවිතා කරමින් පද්ධතියේ විවිධ භූමිකාවන් ඉටු කළ යුතුය.

**ස්මාර්ට් රෙමිට් පද්ධතිය**

ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව තුළ එම හැඳුනුම්පත විමසීම් කටයුතු සඳහා නියෝජිතයෙකු ලෙස නිර්මාණය කර ඇති අතර දැන් එය ඉවත් කර ඇත.

ද්විගුණනය වූ අයිතමය පද්ධතියෙන් ඉවත් කර ඇත.

ඉලක්කගත දිනය:- 2022.12.31

| | | |
|---|---|---|
| | 10 | |
| 203810 | SEC-IT203810 | සක්‍රියයි |

**<u>ස්මාර්ට් රෙමිට්</u>**

| **පිවිසුම් හැඳුනුම්පත් අංකය** | **පරිශීලක වර්ගය** | **තත්ත්වය** |
|---|---|---|
| 168197 | නියෝජිතයා | සක්‍රියයි |
| 168197 | ලංකා බැංකුවේ ශාඛාව | සක්‍රියයි |

(iii) පහත පරිශීලකයින් මූල්‍යා කාලසීමාව තුළදී පද්ධතියට පිවිස වී නොතිබූ බැවින් 2021 දෙසැම්බර් 31 දිනට ස්කයි ලීස් පද්ධතිය තුළ භාවිත නොකළ පරිශීලක ගිණුම් පවතින බව නිරීක්ෂණය විය. පහත වගුවේ මෙම ගැටලුව සඳහා නියැදියක් දක්වයි.

| **පරිශීලක හැඳුනුම්පත් අංකය** | **ශාඛාව** | **අවසන් වරට පිවිස වූ දිනය (දිනය/මාසය/වර්ෂය)** | **තත්ත්වය** |
|---|---|---|---|
| 877560287V | බී ශ්‍රේණිය - හම්බන්තොට | 2020/02/18 | සක්‍රියයි |
| 133285 | ලංකා බැංකුව | පරිශීලකයා පද්ධතියට පිවිස වී නොමැත. | සක්‍රියයි |
| 141953 | නගර කාර්යාලය | 2013/06/18 | සක්‍රියයි |
| 155342 | ලංකා බැංකුව | 2017/05/16 | සක්‍රියයි |
| 177453 | ලංකා බැංකුව | 2014/01/27 | සක්‍රියයි |
| 177479 | ලංකා බැංකුව | 2013/07/24 | සක්‍රියයි |
| 128604 | වයඹ පළාත | 2020/10/16 | සක්‍රියයි |
| 130457 | 2 වන නගරය | පරිශීලකයා | සක්‍රියයි |

පරිශීලක නිර්මාණය ශාඛා මට්ටමින් හසුරුවන අතර, අධිකාරය පැවරීම සහ පරිශීලක මකාදැමීම යෙදුම් කළමනාකරු විසින් සිදු කරනු ලැබේ.
නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
ඉලක්කගත දිනය:- 2022.12.31

නියමිත කාල සීමාව තුළදී ගැටළු නිවැරදි කිරීමට නිර්දේශ කෙරේ.

| | | | |
|---|---|---|---|
| | කුරුණෑගල | පද්ධතියට පිවිස වී නොමැත. | |
| 166795 | උරුබොක්ක | 2013/10/10 | සක්‍රීයයි |
| 167016 | නියෝජ්‍ය සමාන්‍යාධිකාරී ශාඛා අංශය | 2015/05/15 | සක්‍රීයයි |
| 167298 | තවලම | 2013/07/24 | සක්‍රීයයි |
| 168981 | ලංකා බැංකුව | 2017/12/22 | සක්‍රීයයි |
| 169210 | ජයන්තිපුර | 2020/01/28 | සක්‍රීයයි |
| 169533 | අගලවත්ත | පරිශීලකයා පද්ධතියට පිවිස වී නොමැත. | සක්‍රීයයි |
| 169880 | ප්‍රදේශය 3 උතුරු මැද පළාත | පරිශීලකයා පද්ධතියට පිවිස වී නොමැත. | සක්‍රීයයි |
| 169939 | උතුරු මැද පළාත | 2020/01/31 | සක්‍රීයයි |
| 194465 | නියෝජ්‍ය සමාන්‍යාධිකාරී ශාඛා අංශය | 2015/08/27 | සක්‍රීයයි |
| 200270 | මොරටුමුල්ල | 2015/04/27 | සක්‍රීයයි |
| 200452 | බද්දේගම | 2017/11/17 | සක්‍රීයයි |
| 211079 | නාරාහේන්පිට | 2018/11/02 | සක්‍රීයයි |
| 214479 | බස්නාහිර පළාත දකුණ ප්‍රදේශය 2 | පරිශීලකයා පද්ධතියට පිවිස වී නොමැත. | සක්‍රීයයි |
| 216756 | ගල්කිස්ස | 2018/10/17 | සක්‍රීයයි |
| 228983 | කෑගල්ල ප්‍රදේශය | පරිශීලකයා පද්ධතියට පිවිස වී නොමැත. | සක්‍රීයයි |
| 193194 | හතරලියද්ද | 2018/09/17 | සක්‍රීයයි |

(iv) පහත පද්ධතිවල යෙදුම් මට්ටමේ ආරක්ෂක වින්‍යාසයන් සඳහා බැංකුව ප්‍රමාණවත් මුරපද පරාමිතීන් නියම කර නොමැති බව නිරීක්ෂණය විය. පහත වගුවේ අඩුපාඩු නිරූපණය කෙරේ.

| **මුරපද පරාමිතිය** | **යෙදුම** | **යොදන ලද විධානය** | **ප්‍රමුඛ පරිචය** |
|---|---|---|---|
| අවම මුරපද දිග | පිනකල් ට්‍රෙෂරි | අනුලක්ෂණ 6 | අනුලක්ෂණ 8 හෝ ඊට වැඩි |
| | ස්කයි ලීස් | අනුලක්ෂණ 6 | |
| | වෙළඳ මූල්‍ය | අනුලක්ෂණ 6 | |

**පිනකල් ට්‍රෙෂරි, ස්කයි ලීස්, වෙළඳ මූල්‍ය, බේස් 24 සහ තොග සහ වත්කම් කළමනාකරණය යෙදුම්වල අවම මුරපද දිග**

තාක්ෂණික හැකියාව පවතී; ව්‍යාපාර / පරිශීලක බලපෑම

යෙදුම් මට්ටමේ ආරක්ෂක වින්‍යාසයන් සඳහා ප්‍රමාණවත් මුරපද පරාමිතීන් නියම කිරීමට නිර්දේශ කෙරේ.

| | | | |
|---|---|---|---|
| | බෙස් 24 | අනුලක්ෂණ 6 | |
| | තොග සහ වත්කම් කළමනාකරණය | අනුලක්ෂණ 6 | |
| ප්‍රථමවරට ලොග්-ඔන් වන පරිශීලකයින් සඳහා එක් වරක් භාවිතා කරන මුරපදයක් | වෙළඳ මූල්‍යා | නියම කර නොමැත | ඔව් |
| මුරපදයේ සංකීර්ණත්වය | වෙළඳ මූල්‍යා | නියම කර නොමැත | සක්‍රියයි |
| බල කරන ලද මුරපදය වෙනස් කිරීමේ වාර ගණන* | වෙළඳ මූල්‍යා | දින 90 ** | දින 90 - මුරපද 4 ක් |
| | ස්මාර්ට් රෙමිට් | නියම කර නොමැත | |
| මුරපදයක් නැවත භාවිතා කිරීමට පෙර භාවිතා කළ යුතු මුරපද ගණන.* | වෙළඳ මූල්‍යා | මුරපද 1 | |
| | ස්මාර්ට් රෙමිට් | නියම කර නොමැත | |
| නිෂ්ක්‍රීය සැසියකදී ලොග්-අවුට් කාලය | අයි.සී.බී.එස් | මිනිත්තු 30 | මිනිත්තු 15 ක් හෝ අඩු |
| | ෆිනකල් ට්‍රෙෂරි | මිනිත්තු 30 | |
| | වෙළඳ මූල්‍යා | නියම කර නොමැත | |
| | ස්මාර්ට් රෙමිට් | මිනිත්තු 20 | |

* අවම වශයෙන් වසරක් සඳහා එකම මුරපදය භාවිතා නොකිරීමට මෙම පරාමිති දෙක එකිනෙක සම්බන්ධව සැකසිය යුතුය.

** මෙම පරාමිතිය ප්‍රමාණවත් ලෙස සකසා ඇත.

සමාලෝචනය කළ යුතුය.

**වෙළඳ මූල්‍යා පද්ධතිය**
නව වෙළඳ මූල්‍යා පද්ධතිය ඉහත සඳහන් අවශ්‍යතාවලට අනුකූල වේ.

**ස්මාර්ට් රෙමිට්**
ස්මාර්ට් රෙමිට් පද්ධතියේ මෙම විශේෂාංග නොමැති වීම සැපයුම්කරුට දන්වා ඇත. ස්මාර්ට් රෙමිට්හි මෑතකදී සිදු කරන ලද නැවත වැඩ සමඟ වෙනස් විය.

**අයි.සී.බී.එස්**
විවිධ පරිශීලකයින් සඳහා විවිධ සැසි කාල සීමාවන්, ඔවුන්ගේ රැකියා භූමිකාවන් මත නියම කිරීම අයි.සී.බී.එස් පද්ධතිය තුළ අත්‍යවශ්‍ය වේ, කෙසේ වෙතත් මෙම පහසුකම වත්මන් අයි.සී.බී.එස් පද්ධතිය තුළ නොමැත.

(v) අයි.සී.බී.එස් සහ ෆිනකල් ට්‍රෙෂරි යෙදුම් සඳහා තෝරාගත් නියැදියට අනුව වෙනස් කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය තුළ රාජකාරි වෙන් කිරීම නොපවතින බව නිරීක්ෂණය විය. එවැනි ගැටළු පහත වගුවේ දක්වා ඇත.

**අයි.සී.බී.එස්**
මෙම සියලු නිවැරදි කිරීම් යෙදුම් සැපයුම්කරු (Fiserv) විසින් එවන ලද අතර ඒවා ඩීඑච්ඒ ජයරත්න විසින් සංවර්ධනය

හඳුනාගත් පද්ධතිවල රාජකාරි වෙන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ.

කර නොමැත.

**ෆිනකල් ට්‍රෙෂරි**
ආමන්ත්‍රණය කර ඇත.
සම්පත් සීමාවන් හේතුවෙන් ගැටලුව ඇති වී ඇති අතර අනාගත සංවර්ධනයන් මගින් එය නිවැරදි කරනු ඇත.

**<u>අයි.සී.බී.එස්</u>**

| **වෙනස් කිරීමේ අංකය** | **වෙනස් කිරීමේ විස්තරය** | **වෙනස් කිරීම සංවර්ධනය කළ පාර්ශවය** |
|---|---|---|
| CSO 5034607 | සන්නිවේදන සේවාව හරහා සිදු කරන ලද චෙක් පොත් ඇණවුම් සඳහා පරිශීලක හැඳුනුම්පත නොපෙන්වයි - වාර්තාව TA0800P1 | ඩීඑච්ජ් ජයරත්න - ජොෂ්ඨ පද්ධති විශ්ලේෂක |
| BOCLP24 | ණය නඩත්තු ලොගින් (පසු ක්‍රියාත්මක කිරීමෙන් නිවැරදි කිරීම) | ඩීඑච්ජ් ජයරත්න - ජොෂ්ඨ පද්ධති විශ්ලේෂක |
| BOCLP23 | ඩෙබිට් කාඩ් ග්‍රීන් පින් ක්‍රියාත්මක කිරීම | ඩීඑච්ජ් ජයරත්න - ජොෂ්ඨ පද්ධති විශ්ලේෂක |
| BOCLP27 | ඩෙබිට් කාඩ් ග්‍රීන් පින් ක්‍රියාත්මක කිරීම | ඩීඑච්ජ් ජයරත්න - ජොෂ්ඨ පද්ධති විශ්ලේෂක |
| CSO05551955 | අයිබීඑස්ඩී සහ අයිබීසීඩී යන ගනුදෙනු කේත සමඟ පැවතෙන S/O ණය ආපසු හැරවීම් පිළිබඳ ගැටලුව | ඩීඑච්ජ් ජයරත්න - ජොෂ්ඨ පද්ධති විශ්ලේෂක |

**<u>ෆිනකල් ට්‍රෙෂරි යෙදවුම</u>**

| **වෙනස් කිරීමේ අංකය** | **වෙනස් කිරීමේ විස්තරය** | **වෙනස් කිරීම සංවර්ධනය කළ පාර්ශවය** |
|---|---|---|
| 05 | ෆිනකල් ට්‍රෙෂරි පද්ධතියේ විනිමය අනුපාත වක්‍රලේඛයට නව මුදල් | එස්එම්එස්සී විපුලසේන- පද්ධති |

| | | |
|---|---|---|
| | (ටීඑච්බී) එකතු කිරීම සහ මූලික බැංකු පද්ධතියට cared rates ප්‍රකාශයට පත් කිරීම | විශ්ලේෂක II |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 37.6 ක ලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. බිලියන 17.8 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 19.8 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොලී ආදායම පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 34.2 කින් හෙවත් සියයට 15 කින් ඉහළ යාම ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| විස්තර | විචලා මුදල වැඩි වීම/ (අඩු වීම) (රු .බිලියන) | විචලනය % | විචලාතාවයට හේතුව |
|---|---|---|---|
| පොලී ආදායම | 34.2 | 15 | ප්‍රධාන වශයෙන් පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ දළ ණය හා අත්තිකාරම් සහ ආයෝජන ඉහළ යාම හේතුවෙන් පොලී ආදායම ඉහළ ගොස් ඇත.<br><br>සමාලෝචිත වර්ෂය සඳහා දළ ණය හා අත්තිකාරම් පෙර වසර හා සසඳන විට රු. බිලියන 461.5 කින් හෙවත් සියයට 22 කින් වැඩි වී ඇත.<br><br>සමාලෝචිත වර්ෂය සඳහා වන මුළු ආයෝජනය පෙර වසර හා සසඳන විට රු. බිලියන 338 කින් හෙවත් සියයට 43 කින් වැඩි වී ඇත. භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ බැංකු අයිරාව පියවීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන හේතුව විය. |
| පොලී වියදම | (2.2) | 2 | වසර පුරා පැවති අඩු පොලී අනුපාත හේතුවෙන් පොලී වියදම අඩු වී ඇත.<br>කෙසේ වෙතත්, පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ තැන්පතු පදනම රු. බිලියන 392.1 කින් හෙවත් සියයට 16 කින් ඉහළ ගොස් ඇත. |

| | | | |
|---|---|---|---|
| | | | පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළදී ණය ගැනීම්ද රු. බිලියන 263 කින් හෙවත් සියයට 146 කින් ඉහළ ගොස් ඇත. |
| ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු | 12.5 | 40 | අදියර II සහ III හි ණය ප්‍රමාණය වැඩි වීම, රජයේ සහ රාජ්‍ය ව්‍යවසායන් හි විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද ණය සහ වෙනත් ආයෝජන සඳහා ප්‍රතිපාදන සැලසීම, සංචාරක ව්‍යාපාරය සහ ඉදිකිරීම් වැනි අවදානම් ඉහළ කර්මාන්ත සඳහා හානිකරණ ප්‍රතිපාදන වැඩි වීම සහ බැංකුවේ අදියර I හි ණය කළඹ වැඩි වීම හේතුවෙන් අදියර I හි හානිකරණ ප්‍රතිපාදන වැඩි වීම ආදිය හේතුවෙන් ප්‍රධාන වශයෙන් හානිකරණ වියදම ඉහළ ගොස් ඇත. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තර | කර්මාන්තයේ අනුපාතය * | බැංකුව | |
|---|---|---|---|
| | | **2021** | **2020** |
| **කාර්ය සාධන අනුපාත** | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 10.9 | 21.0 | 11.9 |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඒ) | 1.0 | 1.3 | 0.9 |
| පොලී ආන්තිකය | 3.1 | 3.3 | 2.8 |
| **වත්කම්වල ගුණාත්මක අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් ( එන්.පී.එල්) | 4.7 | 5.1 | 5.0 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 9 %) | 13.1 | 14.3 | 11.2 |
| මුළු ප්‍රාග්ධනය (අවම 13 %) | 16.7 | 17.8 | 14.9 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** (අවම අවශ්‍යතාව 20% | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) | 33.8 | 25 | 26.6 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද වාර්ෂික තොරතුරුවලින් කර්මාන්තයේ අනුපාත උපුටා ගෙන ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | බැංකුවේ එවකට මහා කළමණාකරු විශ්‍රාම යාමේදී බැංකුවේ වැටුප් ප්‍රතිපත්තියට අනුව ඔහුට පවරා ඇති වාහනය මිලදී ගෙන ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.<br>• බැංකුවේ වැඩබලන මහා කළමණාකරු ලෙස වැඩ භාර ගන්නා අවස්ථාවේදී බැංකුවේ එවකට මහා කළමණාකරු, ඔහු නියෝජ්‍ය මහා කළමණාකරු ලෙස කටයුතු කරන විට පවරා තිබූ වාහනය (නිසාන් XTrial ජීප් රථය) වෙනුවට බැංකුව විසින් සංචිත වාහනයක් (ටොයෝටා ලැන්ඩ් කෲසර් ප්‍රාඩෝ ඩීසල් වාහනය) පවරා ඇත. ප්‍රවාහන කළමනාකරු විසින් අදාළ වාහන ගොනුවේ තබා ඇති සටහන හැර මෙම පැවරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් හෝ නීත්‍යානුකූල ලියවිල්ලක් නොතිබුණි.<br>• සුදුසුකම් ඇති පුද්ගලයින්ට සංචිත වාහනයක් පැවරීමේදී අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් නොමැති බව නිරීක්ෂණය විය.<br>• පවරන ලද වාහනයේ අයිතිය තමන්ට පැවරීමට අනුමැතිය ඉල්ලා සභාපතිවරයාට ඉදිරිපත් කළ සංදේශයට හිටපු මහා කළමණාකරු අත්සන් කිරීමත් සමඟ බැඳියා ගැටුමක් නිරීක්ෂණය විය.<br>• බැංකුවේ විශ්‍රාමික මහා කළමණාකාරවරයකුගේ ගෞරවය රැකගැනීමේ අරමුණින් මහා කළමණාකාරවරයා වශයෙන් බැංකුවේ අවම වශයෙන් වසර 3 ක සේවා කාලයක් ඇති බැංකුවේ මහා කළමණාකාරවරයකු විශ්‍රාම යාමට වසර 2 කට පෙර නව වාහනයක් ලබා ගැනීමට අවසර දිය යුතු බව මානව සම්පත් හා වේතන කමිටුව 2016 අගෝස්තු 16 වැනි දින පැවති එහි රැස්වීමේදී මූලික වශයෙන් නිර්දේශ කළ ඇත. කෙසේ වෙතත්, ඉහත වෙනස්කම් ඇතුළත් කරමින් බැංකුවේ වේතන ප්‍රතිපත්තිය, විශ්‍රාම ප්‍රතිලාභ අංශය විසින් සංශෝධනය කර නොමැත. ඉහත සංශෝධනවලට අනුව හිටපු මහා කළමණාකාරවරයාට බැංකුවේ නියෝජ්‍ය මහා කළමණාකාරවරයා ලෙස කටයුතු කරන විට පවරා තිබූ නිසාන් XTrial ජීප් රථය මිලදී ගැනීමට පමණක් හිමිකම් ඇති බව නිරීක්ෂණය විය. | අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇත. (රැස්වීම් සටහන් අංක 2021.08.19/4.2) ගුණසේකර මහතා මහා කළමණාකරු ලෙස සංදේශයට අත්සන් තබා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව ගනුදෙනුව සිදු විය. (රැස්වීම් සටහන් අංක 2021.08.19/4.2) | සුදුසුකම් ඇති පුද්ගලයින්ට සංචිත වාහනයක් පැවරීම සඳහා නිසි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. |
| (ii) | වාහන ආනයනය සීමා කර ඇති කාලය තුළදී මුදල් අමාත්‍යාංශය වෙනුවෙන් වාහන ආනයනය කිරීම සඳහා බැංකුව ණයවර ලිපි විවෘත කර ඇත. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | ආනයන අපනයන පාලකගේ අනුමැතිය ඇතිව සියලුම ණයවර ලිපි විවෘත කර ඇත. | සුදුසු අනුමැතීන් සහිතව ණයවර ලිපි විවෘත කිරීමට නිර්දේශ කෙරේ. |

- මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2021 මාර්තු 18 දිනැති අංක BD/GPS/13/01/2021 ලිපියට අනුව, බැංකුව විසින් 2021 අප්‍රේල් 21 වන දින මුදල් අමාත්‍යාංශය සඳහා මෝටර් ජීප් රථ 225 ක්, ඩබල් කැබ් 50 ක්, ඉහළ වහළය සහිත ගිලන් රථ 50 ක් සහ ජල බවුසර් 50 ක් ආනයනය කිරීම සඳහා ණයවර ලිපි 8 ක් විවෘත කර ඇත.
- එම කාලය තුළදී වාහන ආනයනය සඳහා පනවා තිබූ තහනම ඉවත් කර ගැනීමට කැබිනට් අනුමැතිය ලැබී නැත.
- ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2021 අප්‍රේල් 23 වන දින එනම් 2021 අප්‍රේල් 21 දින ණයවර ලිපි පහසුකම් විවෘත කිරීමෙන් පසුව ප්‍රදානය කර තිබුණි.
- අනතුරුව, මුදල් අමාත්‍යාංශය විසින් 2021 මැයි 28 වැනි දින ලිපියක් මගින් කරන ලද ඉල්ලීමකට අනුව නවතම ටොයෝටා ලෑන්ඩ් කෲසර් ප්‍රාඩෝ ජීප් රථ 225 ක් ආනයනය කිරීම සඳහා විවෘත කර ඇති ණයවර ලිපි 03 අවලංගු කර තිබුණි. ආරවුලකින් තොරව ණයවර ලිපි අවලංගු කලද අවශ්‍ය අනුමැතීන් ලබා නොගෙන ණයවර ලිපි විවෘත කිරීමෙන් බැංකුව දැඩි අවදානමක් ගෙන ඇති බව පැහැදිලිය. එසේ නොමැතිනම් අවලංගු කිරීම සඳහා දඩයක් ලෙස බැංකුවට රු.6,047,048 ක මුදලක් දැරීමට සිදු විය හැක.
- ආනයනික වාහනවල මූල්‍ය කල්බදු සඳහා යෝජිත වාර්ෂික පොලී අනුපාතය සියයට 7.5 වූ අතර එය වෙළඳපොළ පොලී අනුපාතයට වඩා අඩුය.
- ආනයනය කරන ලද සමහර වාහන දැනටමත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු කිහිපයකට බෙදා හැර ඇතත් බෙදා හරින ලද වාහන සඳහා තවමත් කල්බදු පහසුකම් නිර්මාණය කර නොමැත.
- බැංකුව විසින් ණයවර ලිපි හරහා සම්පූර්ණ ගෙවීම් සිදු කර අතර සියලුම වාහන 2021 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇත. මෙම වාහන ආනයනය සඳහා බැංකුව දළ වශයෙන් රු. මිලියන 1,140 ක් වැය කර ඇත. ආනයනය කර මාස 11 ක් ගතවී ඇතත් මේ දක්වා වාහන සඳහා කිසිදු කල්බදු ගෙවීමක් බැංකුවට ලැබී නොතිබුණි.
- සමහර වාහන ලියාපදිංචි කර අනෙකුත් රාජ්‍ය ආයතනවලට බෙදා හැර ඇතත් ආනයනය කරන සියලුම වාහනවල පරම අයිතිය බැංකුව සතු වේ. මෙම වාහන වෙනත් ආයතන විසින් භාවිත කිරීමේදී සිදුවිය හැකි හානි හෝ පාඩු හේතුවෙන් බැංකුව ඉහළ අවදානමක් දරයි.
- ජල බවුසර් 35 ක් සහ හයිලක්ස් කැබ් රථ 4 ක් බෙදා හැර නොතිබූ අතර ආනයනය සඳහා පූර්ව නිශ්චිත

වෙළඳ සේවා දෙපාර්තමේන්තුවට අනුව, 2021.04.23 සහ 2021.04.29 යන දිනවල ණයවර ලිපි විවෘත කරන ලද අතර, එය ආනයන අපනයන පාලකගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව වේ.

මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම මත ණයවර ලිපි අවලංගු කිරීම සිදු කර ඇත. අදාළ පාර්ශව සමඟ පැවති සාකච්ඡාවලින් පසු එය අවලංගු කරන ලෙස මුදල් අමාත්‍යාංශය ඉල්ලා ඇත.

කල්බදු පහසුකම් ඉල්ලා සිටින අවස්ථාවේ සහ ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ වෙළඳපොළ අනුපාතය අඩු මට්ටමක පැවතුනි. එසේම, ඉහළ පොලී අනුපාත යොදා ගැනීමට මුදල් අමාත්‍යාංශයට ඉල්ලීම් කිහිපයක් යවා ඇත. ඉල්ලීම් පිළිගෙන නොතිබුණි.

සියලුම කල්බදු පහසුකම් 2022.10.21 දින සක්‍රීය කර ඇත.

ගිවිසුමට අනුව, අපේක්ෂිත කාලය සඳහා සියයට 7.5 ක වාර්ෂික පොලියක් අය කරනු ඇත.

සෑම වාහනයක් සඳහාම විස්තීරණ

| | | | |
|---|---|---|---|
| | අවශ්‍යතාවයක් නොතිබීම හෝ අවශ්‍ය පාර්ශව අතර බෙදා හැරීමට වත්මන් සැලැස්මක් හෝ නොතිබීම හේතුවෙන් ඒවා ලියාපදිංචි කළ නොතිබුණි. මෙම භාර නොදුන් වාහන සඳහා රක්ෂණ වාරිකයක් බැංකුව විසින් ගෙවනු ලබන අතර එමඟින් බැංකුවට සැලකිය යුතු පිරිවැයක් දැරීමට සිදු විය. 2021 ඔක්තෝබර් සිට 2022 අගෝස්තු දක්වා කාලය සඳහා රු. 1,034,982 ක රක්ෂණ වාරික මුදලක් බැංකුව විසින් ගෙවා ඇත.<br>• වහාම භාරදීමට සූදානම් නැති ගිලන්රථ 25 ක් 2022 මාර්තු මාසයේ සිට රක්‍ෂණ ආවරණයෙන් ඉවත් කර ඇත. එම නිසා, තවමත් කල්බදු පහසුකම් නිර්මාණය කර නොමැති බැවින් වාහන අංගනයේ ඇති මෙම ගිලන්රථවලට යම් හානියක් සිදුවුවහොත් අලාභ අයකර ගැනීමට ක්‍රමයක් නොමැති අතර වාහනවල පරම අයිතිය තවමත් බැංකුව වෙත පැවරී ඇත. | රක්ෂණයක් අදාළ රාජ්‍ය ආයතනය මගින් ලබාගෙන ලංකා බැංකුවට පවරා ඇත. වාහන බෙදා හැරීම මුදල් අමාත්‍යාංශය මගින් සිදු කෙරේ. බැංකුව විසින් ගෙවන ලද රක්ෂණ පිරිවැය කල්බදු පහසුකම් සඳහා මූල්‍යකරණය කරන ලද මුදලට එකතු කර ඇත. අදාළ වාහන අංගනයේ රක්ෂණය දැනටමත් පවරා ඇති ආයතනය විසින් ලබාගෙන ඇත. | |
| (iii) | 2020 ඔක්තෝබර් 19 වැනි දින ප්‍රදානය කරන ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් 2020 නොවැම්බර් 06 සහ 2020 නොවැම්බර් 17 දිනැති ලිපි මගින් දන්වා ඇති පරිදි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් බැංකුවේ සංවර්ධිත දේපළ 3 ක් කොවිඩ් -19 විපතට පත් පුද්ගලයින් සඳහා නිරෝධායන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ශ්‍රී ලංකා යුද හමුදාව තාවකාලිකව පවරා දෙන ලෙස ඉල්ලා ඇත. ඉන් අනතුරුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම මත තවත් දේපළ 2 ක් පවරා දී තිබේ. දේපල පැවරීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබාගෙන ඇත. මෙම භාරදීම තාවකාලික පදනමක් මත සිදු කර ඇති අතර මේ සම්බන්ධයෙන් බැංකුව විසින් විධිමත් ගිවිසුමක් ඇති කර ගෙන නොමැත. එසේම, පවරන ලද දේපල පැවරීමට පෙර බැංකුව වන්දි මුදල සාකච්ඡා කර නොතිබුණි.<br>දැනට නාගරික සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ශ්‍රී ලංකා රජය විසින් දේපළ අත්පත් කර ගැනීමට නියමිතය. පවරන ලද දේපල පැවරීමට පෙර වන්දි මුදල සාකච්ඡා කිරීමට බැංකුව අපොහොසත් වීම සහ රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තීරණය කරනු ලබන වටිනාකම එවැනි දේපලවල වෙළඳපොළ වටිනාකමට වඩා අඩු වීමට හැකියාවක් පැවතීම හේතුවෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 49 වැනි වගන්තිය උල්ලංඝණය වීමට ඉඩ ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දී ඇත. රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව තවමත් සිදු කිරීමට නියමිතය.<br>පහත වගුවේ පවරන ලද දේපල 5 ක විස්තර නිරූපණය කෙරේ. | අදහස් සටහන් කර ගෙන ඇත. | 1988 අංක 30 දරන බැංකු පනතේ 49 වගන්තියට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

| අංකය | දේපල විස්තරය | පහසුකම මාරු කිරීමේ දිනය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ දිනය |
|---|---|---|---|
| 01 | ට්‍රයි-ස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්) සමාගම - අංක 30, මාලිගාව, රත්මලාන | 2020/11/10 | 2020/12/03 |
| 02 | කමල් කේබල්ස් (පුද්) සමාගම - අංක 30, කන්දවල පාර, රත්මලාන | 2020/11/10 | 2020/12/03 |
| 03 | ට්‍රයි-ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට් (පුද්) සමාගම - අංක 88, තෙල්වල, රත්මලාන | 2020/12/14 | 2020/12/03 |
| 04 | ට්‍රයි-ස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට් (පුද්) සමාගම - අංක 154, රාහුල මාවත, කටුබැද්ද, මොරටුව | 2021/02/16 | 2021/03/18 |
| 05 | ට්‍රයි-ස්ටාර් ඇපරල් එක්ස්පෝට් (පුද්) සමාගම - අංක 29/5, කන්දවල පාර, රත්මලාන | 2021/02/16 | 2021/03/18 |

## 3.2 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකුවට අයත් යෝර්ක් වීදියේ පිහිටි මහල් 6 කින් යුත් ගොඩනැගිල්ලක වර්ග අඩි 261,610 ක මුළු භූමි ප්‍රමාණයෙන් වර්ග අඩි 163,890 ක ප්‍රමාණයක් 2013 වසර දක්වා මෙට්‍රොපොලිටන් ශාඛාව සහ බස්නාහිර පළාත් උතුරු කාර්යාලය භාවිතා කර තිබුණි. සෙසු බිම් ප්‍රදේශ හෝටල්ස් කොළඹ (1963) සමාගම විසින් තවමත් භාවිතා කරනු ලැබේ. 2013 වසරේ සිට සැලකිය යුතු ප්‍රදේශයක් හෙවත් | මෙම කාරණය සඳහා වැඩිදුර තීරණයක් ගැනීමට නියමිතය. | පැවරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට නිර්දේශ කෙරේ. |

ගොඩනැගිල්ලෙන් සියයට 60 කට වැඩි ප්‍රමාණයක් අක්‍රියව පවතී. 2016 ඔක්තෝබර් 17 දිනැති තක්සේරු වාර්තාවට අනුව ඉඩමේ සහ ගොඩනැගිල්ලේ වටිනාකම රු. මිලියන 3,413 කි.

2020 මාර්තු 04 සහ 2020 ජූලි 08 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතීන්ට අනුව හෝටල්ස් කොළඹ (1963) සමාගම සෙලෙන්ඩිවා ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම සමඟ ඒකාබද්ධ කිරීමටත්, යෝර්ක් වීදි ගොඩනැගිල්ලේ අයිතිය සෙලෙන්ඩිවා ඉන්වෙස්ට්මන්ට්ස් සමාගම වෙත පැවරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. කෙසේ වෙතත්, පැවරීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී.

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 ඡේදයට අනුව 2021 මුදල් වර්ෂය සඳහා බැංකුව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. කෙසේ වෙතත්, 2006 දී ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් නිකුත් කරන ලද ප්‍රසම්පාදන අත්පොතේ 4.2.1 වගන්තියේ නියම කර ඇති පරිදි ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රමාණවත් විස්තර ලබා නොදෙයි. | ඉදිරි ප්‍රසම්පාදන සැලැස්මේ මෙම හිඩැස් නිවැරදි කිරීමට කටයුතු සම්පාදනය කෙරේ. ඉලක්ක දිනය:- 2023/01/31 | නියමිත කාලය තුළදී ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීමට නිර්දේශ කෙරේ. |
| (ii) | 2021 වර්ෂය තුළදී බැංකුවේ ඉලක්කගත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලට සාපේක්ෂව ලබා ගත් ප්‍රගතිය විශ්ලේෂණය කිරීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. එම විස්තර පහත සාරාංශගත කර ඇත. | අයවැයෙන් මුදල් වෙන් කළත් ඒ අවස්ථාවේ පැවති තත්ත්වය මත අරමුදල් භාවිතා කර ඇත. | සැබෑ තත්ත්වයන් මත පදනම්ව වාර්ෂික අයවැය සකස් කිරීමට නිර්දේශ කෙරේ. |

| ප්‍රසම්පාදන වර්ගය | 2021 වසර සඳහා අයවැය (රු.'000) | 2021 වර්ෂය සඳහා තථ්‍ය වියදම් (රු.'000) | විචලනය (රු.'000) | විචලනය % |
|---|---|---|---|---|
| කාර්යාල යන්ත්‍ර/කාර්යාල උපකරණ | 358,340 | 56,556 | 301,784 | 84% |
| ගෘහභාණ්ඩ | 55,209 | 37,724 | 17,485 | 32% |
| ආරක්ෂක උපකරණ | 207,000 | 1,475 | 205,525 | 99% |
| වාහන | 405,000 | - | 405,000 | 100% |
| පරිගණක උපකරණ | 5,351,500 | 884,035 | 4,467,465 | 83% |
| ඉදිකිරීම්/ගොඩනැගිලි | 3,748,680 | 1,232,425 | 2,516,255 | 67% |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති | | | | |
| නව ඉඩම් මිලදී ගැනීම | 1,105,500 | 25,062 | 1,080,438 | 98% |
| සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්) සමාගම සඳහා මිලදී ගැනීම | 36,241 | 23,414 | 12,827 | 35% |
| අවිනිශ්චිත අවස්ථා | 100,000 | - | 100,000 | 100% |
| **එකතුව** | **11,367,470** | **2,260,691** | | |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

**විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

(i) 2021 මුදල් වර්ෂය සඳහා බැංකුවේ පුරප්පාඩු පහත වගුවේ දක්වා ඇත.

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | පුරප්පාඩු (අනුමත සේවක සංඛ්‍යාවෙන් % ක් ලෙස) |
|---|---|---|---|---|
| ආයතනික මට්ටම | 20 | 17 | 3 | 15 |
| විධායක මට්ටම | 56 | 55 | 1 | 2 |
| මෙහෙයුම් මට්ටම | 10,848 | 9,705 | 1,143 | 11 |
| එකතුව | **10,924** | **9,777** | **1,147** | **10** |

2021 දෙසැම්බර් 31 වන විට ආයතනික මට්ටමේ කාර්ය මණ්ඩලය සියයට 15 ක්, විධායක මට්ටමේ කාර්ය මණ්ඩලය සියයට 2 ක් සහ මෙහෙයුම් මට්ටමේ කාර්ය මණ්ඩලය සියයට 11 ක් පුරප්පාඩු වී ඇති බව නිරීක්ෂණය විය.

ආයතනික මට්ටමේ එකම පුරප්පාඩු තනතුර ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර වන අතර 2022.10.27 දිනට විධායක මට්ටමේ තනතුරේ පුරප්පාඩු නොමැත. කොන්ත්‍රාත් පදනම මත ප්‍රධාන අභ්‍යන්තර විගණක බඳවා ගැනීමට බැංකුව කටයුතු කරමින් සිටී. එසේම, බැංකුව විසින් ඉහළ ශ්‍රේණිවල පුරප්පාඩු පිරවීම සඳහා බොහෝ සේවකයින් උසස් කර ඇති අතර ප්‍රවේශ මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවා ඇත.

බැංකුවේ කටයුතු සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

(ii) සහකාර මහා කළමණාකාර 01 ක් අයකු, ප්‍රධාන කළමනාකරුවන් 12 දෙනෙකු, ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරුන් 64 දෙනෙකු, කළමනාකරුවන් 61 දෙනෙකු, විධායක නිලධාරීන් 167 දෙනෙකු, කනිෂ්ඨ විධායක නිලධාරීන් 578

බැංකුව විසින් 2022.03.08 දින ප්‍රධාන කළමනාකරුවන් 36

බැංකුවේ කටයුතු සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම

| | | |
|---|---|---|
| දෙනෙකු, රහස්‍ය ලේකම්වරුන් 44 දෙනෙකු, මාණ්ඩලික සහකාරවරුන් 360 දෙනෙකු, ලේකම්වරුන් 132 දෙනෙකු, කාර්මික ශිල්පීන් 50 දෙනෙකු, ආරක්ෂක කාර්ය මණ්ඩලයේ 231 දෙනෙකු සහ ආරක්ෂක නිලධාරීන් 06 දෙනෙකු විධායක සහ මෙහෙයුම් මට්ටම්වල පුරප්පාඩුවලට ඇතුළත් විය. | කට, 2021.12.21 දින ජ්‍යෝෂ්ඨ කළමනාකරුවන් 77 කට, 2021.12.14 දින කළමනාකරුවන් 162 කට, 2021.08.05 දින විධායක නිලධාරීන් 381 කට, 2022.02.08 දින මාණ්ඩලික සහකාරවරුන් 50 කට, 2022.10.25 ආරක්ෂක නිලධාරීන් 06 කට උසස්වීම් ලබා දී ඇති අතර මෙහෙයුම් ගැටළු සමඟ උසස්වීම් පැවරුම් ප්‍රමාද විය හැක.<br>තවද, අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාර, කළමනාකරණ අභ්‍යාසලාභීන්, පද්ධති විශ්ලේෂකයින්/ජාල ඉංජිනේරුවන්, අභ්‍යාසලාභී ලේකම් සහකාර වැනි ප්‍රවේශ මට්ටමේ තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම සඳහා බැංකුව බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ඇත.<br>කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ සියලුම බඳවා ගැනීම් අත්හිටුවීමට රජය විසින් නියෝග කර තිබීම හේතුවෙන් (භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2022.04.26 සහ 2022.08.08 දිනැති ලිපිවලට අනුව) මෙම බඳවාගැනීම් සම්පූර්ණ කිරීමට නොහැකි විය. | සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |

එහෙත්, නිශ්චල බඳවා ගැනීම් නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට බැංකුව කටයුතු කරමින් සිටී.

**4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 සංයුක්ත සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 - 2022 සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්මට අනුව බැංකුවේ තෝරාගත් ඉලක්ක ක්‍රියාකාරකම් සඳහා ලබා ඇති ප්‍රගතිය පහත දැක්වේ. | අදහස් සටහන් කර ගෙන ඇත. | යථාර්ථවාදී පදනමකින් සංයුක්ත සැලැස්ම සකස් කිරීමට නිර්දේශ කෙරේ. |

| අංශය | 2020-2022 සංයුක්ත සැලැස්මට අනුව අරමුණ | තථ්‍ය 2020 | අපේක්ෂාව 2021 | තථ්‍ය 2021 | සටහන |
|---|---|---|---|---|---|
| ජාත්‍යන්තර | රන් සාප්පුවේ ලාභය වාර්ෂිකව සියයට 10 කින් වැඩි කිරීම. | රු. මිලියන 9.1 | රු. මිලියන 10.01 | රු. මිලියන 41.8 | 2021 වර්ෂය තුළදී ඉලක්කගත වැඩිවීම ඉක්මවා රන් සාප්පුවේ ලාභය සියයට 359 කින් ඉහළ ගොස් ඇත. |
| | ජාත්‍යන්තර අංශයේ ගාස්තු සහ කොමිස් ආදායම සියයට 15 කින් වැඩි කිරීම. | රු. මිලියන 445 | රු. මිලියන 511.75 | රු. මිලියන 884 | සියයට 15 ක ඉලක්කය වෙනුවට ගාස්තු සහ කොමිස් ආදායම සියයට 98.7කින් වැඩි වී ඇත. |
| | බණ්ඩාරනා | රු. | රු. | රු.මිලියන | සියයට 10 ක |

| | | | | | |
|---|---|---|---|---|---|
| | යක ජාත්‍යාන්තර ගුවන්තොටු පලේ කවුන්ටරවල ව්‍යාපාර පරිමාව වාර්ෂිකව සියයට 10 කින් වැඩි කිරීම. | මිලියන 1,378.12 | මිලියන 1,515.932 | 2,098.12 | ඉලක්කය වෙනුවට බණ්ඩාරනායක ජාත්‍යාන්තර ගුවන්තොටුපලේ කවුන්ටරවල ව්‍යාපාර පරිමාව සියයට 52 කින් වැඩි වී ඇත. |
| භාණ්ඩාගාරය | විදේශ විනිමය ආදායම වාර්ෂිකව සියයට 10 කින් වැඩි කිරීම. | රු. මිලියන 4,111 | රු. මිලියන 4,522.1 | රු. මිලියන 8,856 | 2021 වසර තුළදී විදේශ විනිමය ආදායම සියයට 115.4 කින් ඉහළ ගොස් ඇත. |
| **විදේශීය ශාඛා** | | | | | |
| විදේශීය ශාඛාවල ණය කළඹ සියයට 10 කින් වැඩි කිරීම | අත්තිකාරම් - චෙන්නායි ශාඛාව | රු. මිලියන 10,168 | රු. මිලියන 11,184.8 | රු. මිලියන 11,257.5 | 2021 වසර තුළදී අත්තිකාරම් සියයට 10.7 කින් වැඩි විය. |
| | අත්තිකාරම් - මාලේ ශාඛාව | රු. මිලියන 31,888.06 | රු. මිලියන 35,076.86 | රු. මිලියන 36,613.97 | 2021 වසර තුළදී අත්තිකාරම් සියයට 14.8 කින් වැඩි විය. |
| | අත්තිකාරම් - සීෂෙල්ස් ශාඛාව | රු. මිලියන 1,078.94 | රු. මිලියන 1,186.834 | රු. මිලියන 1,845.73 | 2021 වසර තුළදී අත්තිකාරම් සියයට 71 කින් වැඩි විය. |

## 4.2 අභ්‍යන්තර විගණනය

**විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

(i) 2021 මූල්‍ය වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන සැලැස්මට එරෙහිව ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.

| විස්තර | ඉලක්කය 2021 | තථ්‍ය 2021 | වෙනස |
|---|---|---|---|
| සම්පූර්ණ ශාඛා විගණනය සහ පළාත් කාර්යාල විගණනය | 136 | 161 | **25** |
| හදිසියෙන් කරනු ලබන ශාඛා විගණනයන් | 70 | 164 | **94** |
| ශාඛා විගණනය - පසු විපරම් | 2 | 72 | **70** |
| ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය විගණන | 89 | 121 | **32** |
| තොරතුරු පද්ධති විගණන | 1810 | 1770 | **(40)** |
| **එකතුව** | **2107** | **2287** | **180** |

කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම: අදහස් සටහන් කර ගෙන ඇත.

නිර්දේශය: ඉලක්කගත පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම සාක්ෂාත් කර ගැනීමට නිර්දේශ කෙරේ.

(ii) 2020 සහ 2021 මූල්‍ය වර්ෂවල අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු පහත දක්වා ඇත. අනුමත සේවක සංඛ්‍යාව 187 සමඟ සසඳන විට 2021 මූල්‍ය වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පනස් එකක් (51) නිරීක්ෂණය විය. මීට පෙර වසර තුළදීද මෙවැනිම පුරප්පාඩු සංඛ්‍යාවක් නිරීක්ෂණය වූ අතර එම පුරප්පාඩු පිරවීමට අදාළ බලධාරීන් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොමැත.

| කාර්ය මණ්ඩල කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව | |
|---|---|---|
| | **2021 දෙසැම්බර් 31 දිනට** | **2020 දෙසැම්බර් 31 දිනට** |
| වරලත් ගණකාධිකාරීවරුන් බැංකු නොවන | 02 | 07 |
| ප්‍රධාන කළමනාකරු/ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 10 | 09 |

කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම: ප්‍රධාන කාර්යාලයට සේවකයන් 96 ක් ද පළාත්වලට සේවකයන් 41 ක් ද වශයෙන් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති අතර 2022 සඳහා අනුමත සේවක සංඛ්‍යාවට අනුව 2022.10.27 දිනට පුරප්පාඩු 5 ක් පමණි. ඉතිරි පුරප්පාඩු 5 අනාගත බඳවා ගැනීම්, උසස්වීම් පැවරුම් සහ ස්ථාන මාරුවීම් සමඟින් පුරවනු ලැබේ.
ඉලක්කගත දිනය :- 2023.03.31

නිර්දේශය: අභ්‍යන්තර විගණන අංශයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

| | | |
|---|---|---|
| ශාඛා කළමනාකරු | 07 | 15 |
| සහකාර කළමනාකරු | 06 | 04 |
| විධායක නිලධාරි / විධායක විගණන නිලධාරි / කනිෂ්ඨ විධායක නිලධාරි / කනිෂ්ඨ විගණන නිලධාරි | 25 | 15 |
| මාණ්ඩලික සහකාර/ විගණන සහකාර | (03) | (01) |
| රහස්‍ය ලේකම් | 05 | 05 |
| ලේකම් සහකාර | (01) | 01 |
| **එකතුව** | **51** | **55** |

### 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අයවැය ප්‍රතිපාදන බැංකුවේ තථ්‍ය ප්‍රතිඵල සමඟ සංසන්දනය කිරීමේදී සියයට 16 සිට සියයට 47 දක්වා වූ සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දක්වා ඇත. | අදහස් සටහන් කර ගෙන ඇත. | අයවැය ඉලක්ක සපුරා ගැනීම සඳහා බැංකුවේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට නිර්දේශ කෙරේ. |

රු. මිලියන

| **විස්තර** | තථ්‍ය **2021** | අයවැය **2021** | විචලනය **2021** | විචලනය **%** |
|---|---|---|---|---|
| මුළු ආදායම | 290,362 | 249,300 | 41,062 | 16.47 |
| වැට් සහ එන්.බී.ටී වලට පෙර මෙහෙයුම් ලාභය | 52,217 | 42,258 | 9,959 | 23.57 |
| බදු වලට පෙර ශුද්ධ ලාභය | 43,190 | 33,682 | 9,508 | 22.50 |
| බදු වියදම් | 5,599 | 8,084 | 2,485 | 30.74 |
| කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය | 37,590 | 25,598 | 11,992 | 46.85 |